# අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2025
## අනුහුරු ප්‍රශ්න පත්‍රය

**දේශපාලන විද්‍යාව I**
அரசியல் விஞ்ஞானம் I
Political Science I

**23 S I**

**පැය දෙකයි**
**இரண்டு மணி நேரம்**
Two Hours

විභාග අංකය.........................................

**උපදෙස් :**
*මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* **A** කොටස බහුවරණ ප්‍රශ්න **30**කින් හා **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20**කින් යුක්ත වේ.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **දෙක** බැගින් මුළු ලකුණු **100** කි.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 01 | |
| 2 | 02 - 06 | |
| 3 | 07 - 12 | |
| 4 | 13 - 18 | |
| 5 | 19 - 23 | |
| 6 | 24 - 30 | |
| 7 | 31 - 41 | |
| 8 | 42 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## A කොටස

- අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

01. දේශපාලනය,
   (1). රාජ්‍ය බලය හා සම්බන්ධ ක්‍රියාවලියකි.
   (2). දේශපාලනඥයින් සිය බලය තහවුරු කර ගැනීමට යොදාගන්නා යාන්ත්‍රණයකි.
   (3). ආණ්ඩුව ඇතුළත සිදුවන ක්‍රියාකාරකම් ය.
   (4). රාජ්‍ය, එහි ආයතන හා සමාජය අතර අන්තර් ක්‍රියාකාරකම් සිදුවන ක්ෂේත්‍රයයි.
   (5). ජාත්‍යන්තර පද්ධතිය තුළ රාජ්‍යවල හැසිරීම විස්තර කෙරෙන සංකල්පයකි. (......)

[දෙවැනි පිටුව බලන්න]

02. දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශ,

(1). සාමාන්‍යකරණය කරන ලද පොදු නිගමනවලට එළැඹීම විද්‍යාත්මක ක්‍රමයෙන් සිදු වේ.
(2). අගය විනිශ්චය කිරීම් හා සිතාගැනීම් මත පදනම්ව තුලනාත්මක ප්‍රවේශය ගොඩනැගී ඇත.
(3). ආනුභවික පර්යේෂණ මත පදනම්ව අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය තුළ අධ්‍යයන සිදු වේ.
(4). ඥාන ගවේෂණය සිදුකරන උද්ගාමී ප්‍රවේශයක් ලෙස දාර්ශනික ප්‍රවේශය හඳුනාගත හැකිය.
(5). බාහිර ශික්ෂණයන්ගේ න්‍යාය, සංකල්ප හා විධික්‍රම යොදා ගැනීම බහු විෂයක ප්‍රවේශයෙන් සිදු වේ.
(......)

03. ආණ්ඩුව,

(1). සම්භාව්‍ය දේශපාලන චින්තනය තුළ රාජ්‍යයෙන් වෙන්ව භාවිතා වූවකි.
(2). දීර්ඝ කාලයක් ස්ථාවරව පවතින සමාජයේ අති මූලික දේශපාලන සංවිධානය යි.
(3). ප්‍රජාතන්ත්‍රවාදී වීම අනිවාර්ය වේ.
(4). පූර්ව නූතන අවධියේදී ජනතාව විසින් තෝරා පත් කරන ලදී.
(5). රාජ්‍යයේ ස්වාධිපත්‍යය ක්‍රියාත්මක කරන සංවිධානය යි. (......)

04. දේශපාලන සංකල්පය සහ විස්තරය නිවැරදිව ගලපා ඇති වරණය තෝරන්න.

| | | |
|---|---|---|
| (1). දේශපාලන පක්ෂ | - | පොදු ප්‍රතිපත්ති සහිත මැතිවරණ මගින් පමණක් බලය ලබා ගැනීමට ක්‍රියාත්මක වන ආයතනයකි. |
| (2). බලපෑම් කණ්ඩායම් | - | ආණ්ඩුවේ අභ්‍යන්තරයට ගොස් බලපෑම් කිරීම මූලික අරමුණ කරගෙන ඇත. |
| (3). සිවිල් සමාජය | - | රාජ්‍ය තුළ පමණක් නොව ඉන් පරිබාහිරව ද ක්‍රියාත්මක වේ. |
| (4). දේශපාලන න්‍යාය | - | සමාජ විද්‍යාවන් තුළ ද ස්වාභාවික විද්‍යාවල මෙන් නිශ්චිතව හඳුනාගත හැකිය. |
| (5). දේශපාලන දර්ශනය | - | පොදු ඒකමතිකභාවයක් සහිත මතභේදයකට ලක් නොවන සදාතනික සංකල්පයකි. |

(......)

05. පැසිස්ට්වාදී රාජ්‍ය,

(1). ජාතියේ ප්‍රතිමූර්තිය ජනතාව බව ප්‍රකාශ වේ.
(2). රාජ්‍යයේ බලය අසීමිත හා සර්ව බලධාරී වේ.
(3). රාජ්‍ය සමාජ සංවිධානයක් ලෙස සලකයි.
(4). රණවාදයට වඩා වර්ගවාදය ප්‍රතික්ෂේප කරයි.
(5). පුද්ගල විමුක්තිය සඳහා දේශපාලන සහභාගිත්වය අවශ්‍ය බව දක්වයි. (......)

06. සන්ධීය ආණ්ඩු ක්‍රමය,

(1). තනි රාජ්‍යයක් තුළ ආණ්ඩු අතර පරිපාලන බලය සම්බන්ධීකරණය කිරීමේ ක්‍රමයකි.
(2). ව්‍යවස්ථාදායකය මගින් පනවන පනතක් හරහා බලය බෙදා හැර ඇත.
(3). විශාල හා සජාතීය රාජ්‍යයන් හි පමණක් ක්‍රියාවට නැංවිය හැකි ක්‍රමයකි.
(4). පරිධියේ නියෝජනය මධ්‍යම ආණ්ඩුවට ලබාදීම සඳහා දෙවන මණ්ඩල සංකල්පය භාවිතයට ගනී.
(5). මධ්‍යයේ බලපෑමට යටත්ව පරිධියේ ඒකක සෑම විටම ක්‍රියාත්මක වේ. (......)

07. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය,

(1). ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ නිල කාල එකිනෙකට සමගාමීව අවසන් වේ.
(2). රාජ්‍යය නායකයා හා ආණ්ඩුවේ නායකයා යන තත්ත්වයන් දෙකම එක් අයෙකුට ලැබේ.
(3). බහු වාර්ගික සමාජවල ජාතික අනුකලනය ඇති කිරීමට මඟපාදයි.
(4). හදිසි හා අර්බුදකාරී අවස්ථාවන්ට ක්ෂණික ප්‍රතිචාර සපයන්නක් වේ.
(5). විධායකය ඉවත් කිරීමේ අවස්ථාව ව්‍යවස්ථාදායකයට නොව මහජනතාව වෙත හිමි වේ. (......)

08. ගැටුම් සමථන ක්‍රියාවලිය,

(1). ගැටුම් වැළැක්වීමේ ආරම්භක පියවර ගැටුම් කළමනාකරණය යි.
(2). ගැටුමක මූල හේතු සොයා ඒවාට විසඳුම් ලබාදීම සරල වැළැක්වීමයි.
(3). ගැටුමේ ගතිකත්වය, අරමුණු හා අභිලාෂ වෙනස් කිරීම ගැටුම් පරිවර්තනයයි.
(4). සාම ගිවිසුමකින් හෝ යුද්ධය අවසන් කිරීමෙන් ගැටුම සම්පූර්ණයෙන් සමථනය කළ හැකිය.
(5). ගැටුම සම්පූර්ණයෙන් විසඳීම ඉතා පහසු හා සරල ක්‍රියාවලියකි. (......)

09. ජාතිකවාදය,

(1). දේශපාලනික වශයෙන් මෙන්ම දාර්ශනික වශයෙන් ද බලගතු මතවාදයකි.
(2). ප්‍රධාන ප්‍රවේශ දෙකක් යටතේ හඳුනාගත හැකිය.
(3). ජනවාර්ගික ජාතිකවාදය මෙහි සම්භාව්‍ය ස්වරූපය යි.
(4). භාෂාව, ආගම හා සංස්කෘතිය යනාදී අංග මත වෙන් වෙන්ව සිතන්නට පුරුදු කරයි.
(5). නිශ්චිත චින්තකයෙකු හෝ දාර්ශනිකයෙකු සමග අනන්‍ය වී නොමැත. (......)

10. අන්තර්ජාතික දේශපාලනය,

(1). නිශ්චිත බලාධිකාරයක් සහිත ආණ්ඩුවකින් සමන්විත ය.
(2). වර්තමානය වන විට ද්වි ධ්‍රැවීය ලෝක ක්‍රමයක් නිර්මාණය කර ඇත.
(3). යුද්ධයට වඩා සාමයට අත වනයි.
(4). සඳහා කලාපීය සංවිධාන සිදු කරන බලපෑම අල්ප වේ.
(5). මෙහි ස්වභාවය තීරණය කිරීමෙහි ලා පාරිසරික සාධක එතරම් බලපෑමක් සිදු නොකරයි. (......)

11. රාජ්‍ය ප්‍රතිපත්ති,

(1). නිශ්චිත අරමුණු හා ඉලක්ක මත ගොඩනැගී ඇත.
(2). මහජනයාගේ පොදු හා පෞද්ගලික ගැටලු සඳහා ආමන්ත්‍රණය කරයි.
(3). ක්‍රියාවට නැංවීම දේශපාලනඥයන්ගේ කාර්යයකි.
(4). ආර්ථික ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි.
(5). කාලානුරූපීව සිදුවන උච්ඡාවචනයන් කෙරෙහි අවධානය නොදක්වයි. (......)

12. නීතියේ ආධිපත්‍යය සම්බන්ධයෙන් වඩාත් ගැලපෙන්නේ,

(1). මෙය රටක ප්‍රජාතන්ත්‍රවාදී සෞඛ්‍යය දුර්වල කරයි.
(2). ස්වභාවික නීතිය හා පරිපාලන නීතිය මඟින් සීමා වේ.
(3). ප්ලේටෝගේ පරමාදර්ශී පාලකයා නීතියට අවනත වේ.
(4). මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා තදින් බැඳී පවතී.
(5). 'නීතිය රාජ්‍ය මත පදනම් විය යුතුය' යන්න ඇමරිකානු සංකල්පයකි. (......)

13. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය,

(1). නිර්ධන පංති ආඥාදායකත්වය, ආකෘතිය බවට පත්විය.
(2). ආර්ථික ක්ෂේත්‍රයෙන් රාජ්‍ය බැහැර වීම පිළිගත්තේ ය.
(3). කම්කරු පන්ති විප්ලවය පිළිබඳ අදහසට එකඟ විය.
(4). සාමූහික කේවල් කිරීමක සිට සුභසාධනවාදය පිළිගන්නා ලදී.
(5). නව ලිබරල් ආර්ථික ලක්ෂණ සහිතව ගොඩනගා ඇත. (......)

14. පහත සඳහන් රට හා එහි ආණ්ඩු ලක්ෂණය නිවැරදි ලෙසින් දක්වන වරණය තෝරන්න.

(1). ඇමරිකා එක්සත් ජනපදය - අධිකරණ විමර්ශන බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සෘජුව ම ලබා දී ඇත.
(2). බ්‍රිතාන්‍ය - දීර්ඝකාලීනව අනුගමනය කරන ලද සිරිත් විරිත් හා සම්ප්‍රදායන් සඳහා නෛතික පිළිගැනීම ලබා දී ඇත.
(3). ඉන්දියාව - සන්ධීය තත්ත්වය ව්‍යවස්ථාව තුළින් සෘජුව ම ප්‍රකාශ කර ඇත.
(4). ප්‍රංශය - චාල්ස් ඩිගෝල් විසින් පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ගොඩනැගීමට පදනම දමන ලදී.
(5). ස්විට්සර්ලන්තය - ෆෙඩරල් ව්‍යවස්ථාවේ පළමු වගන්තියට අනුව පූර්ණ කැන්ටන් 26ක් හා අර්ධ කැන්ටන් 6ක් ක්‍රියාත්මක වේ. (......)

15. ප්‍රංශ ආණ්ඩුක්‍රමය,

(1). දේශපාලන බලය විමධ්‍යගතකරණයකට නැඹුරු වී ඇත.
(2). ඒකීය රාජ්‍යයක් පවතින නිසා ව්‍යවස්ථාදායකය එක් මණ්ඩලයකින් සමන්විත වේ.
(3). අමාත්‍ය මණ්ඩලය ජනාධිපති විසින් ව්‍යවස්ථාදායකය තුළින් තෝරා පත් කරයි.
(4). අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කොට පවත්වාගෙන යාමේ උත්තරීතර බේරුම්කරුවා ජනාධිපති ය.
(5). උප ජාතික ආණ්ඩු කලාප හා කොමියුන යටතේ පමණක් සංවිධානය කර ඇත. (......)

16. අන්තර්ජාතික දේශපාලනයේ රාජ්‍ය නොවන සංවිධානයක් වන්නේ,

(1). රතු කුරුස සංවිධානය
(2). සාර්ක් සංවිධානය
(3). යුරෝපා සංගමය
(4). උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය
(5). ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (......)

17. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය,

(1). නිදහස ලබා ගැනීමට පෙර යුගයේ වඩාත් විධිමත් ලෙස ක්‍රියාත්මක විය.
(2). ජන සමාජයේ අදහස් විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීමට බලපාන්නේ නැත.
(3). අභ්‍යන්තර සමාජ, දේශපාලන හා ආර්ථික විචල්‍යන්ගෙන් වියුක්ත වූවකි.
(4). කලාපීය හා ජාත්‍යන්තර බල තුලනයන් මත තීරණය නොවේ.
(5). භූ දේශපාලන පිහිටීම අනිවාර්ය සාධකයක් බවට පත්ව ඇත. (......)

18. ස්වාධිපත්‍යය බලය,

(1). විශාල හා කුඩා රාජ්‍ය අතර පවතින අසමානතා පිළිගනී.
(2). රාජ්‍යයේ කැමැත්ත ක්‍රියාවට නැංවීමට සුජාතභාවය සපයයි.
(3). ගෝලීයකරණය හමුවේ ශක්තිමත් වී ඇත.
(4). උපරිජාතික සංවිධානවල බලපෑමට හසු නොවේ.
(5). රාජ්‍ය සතු දේශසීමාව තුළත් ඉන් පිටතටත් යෙදවිය හැකිය. (......)

[පස්වැනි පිටුව බලන්න]

19. සමූහාණ්ඩුවාදය,

(1). රාජාණ්ඩුවාදයට එකහෙලා විරුද්ධ මතවාදයකි.
(2). පරමාධිපත්‍ය බලයේ හිමිකරුවා පාලකයා විය.
(3). ලිබරල්වාදයට විකල්පයක් ලෙස ගොඩනැගුනකි.
(4). රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් පත්විය යුතු බව පිළිනොගනී.
(5). දේශපාලන ආධිපත්‍යය සමඟ නිදහස සාක්ෂාත් කරගත යුතු බව දක්වයි. (......)

20. බලතල බෙදීම,

(1). වෙන් කරනු ලැබූ බලය ආණ්ඩුවේ එක් ශාඛාවක් මගින් ක්‍රියාවට නැංවිය යුතු බව දක්වයි.
(2). පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක වඩාත් හොඳින් ක්‍රියාත්මක කළ හැකිය.
(3). පරම බලය දූෂණයට ඉවහල් නොවන බව අවධාරණය කරයි.
(4). පුද්ගල නිදහස ආරක්ෂා කිරීමට සර්ව බලධාරී රාජාණ්ඩු ක්‍රමයට විකල්ප යෝජනා කිරීමක් වේ.
(5). ඇමරිකානු ආණ්ඩුක්‍රමය ඇසුරින් ඉදිරිපත් කර ඇත. (......)

- අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරන්න.

21. කෝල්බෲක් කොමිසම,
A - ඉදිරිපත් කළ නිර්දේශ කෙරෙහි එංගලන්තයේ කාර්මික විප්ලවය සමඟ බිහි වූ අදහස් බලපා ඇත.
B - ආණ්ඩුව මගින් සිදු කළ සියලු ආකාරයේ වෙළෙඳ ආයෝජනයන්ට විරුද්ධ විය.
C - ලංකාවට පැමිණෙන විට මෙරට පරිපාලන ක්‍රම තුනක් පැවතිණි.
D - ඉදිරිපත් කළ නිර්දේශ 'නීතියේ ආධිපත්‍යය' ක්‍රියාත්මක කරවීමට ද උත්සාහ කිරීමකි.
E - යෝජනා කළ ව්‍යවස්ථාදායක සභාවට අයවැය සම්බන්ධ බලතල හිමි විය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

22. ඩොනමෝර් ප්‍රතිසංස්කරණය,

A - ලන්ඩන් කෝරල සභා ක්‍රමයෙන් ආභාසය ලැබීය.
B - මේ යටතේ ව්‍යවස්ථා ව්‍යුහයේ ප්‍රධානතම ලක්ෂණය වූයේ විධායක කාරක සභා ක්‍රමය යි.
C - බලවත් දේශපාලන ව්‍යාපාරයක මෙහෙය වීමෙන් තොරව ලාංකිකයන්ට සර්වජන ඡන්ද බලය ලැබුණි.
D - පනත් කෙටුම්පතක් අනුමත නොකර නිෂේධ බලය පාවිච්චි කිරීමේ හැකියාව මේ යටතේ ආණ්ඩුකරුට හිමි විය.
E - නිල බලයෙන්ම මහලේකම්වරයාට ඕනෑම විධායක කාරක සභා රැස්වීමකට මැදිහත් වීමේ සහ ඡන්දය ප්‍රකාශ කිරීමේ හැකියාව තිබුණි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

23 සෝල්බරි ව්‍යවස්ථාව,
A - ක්‍රියාත්මක වූ කාලය තුළ එම ව්‍යවස්ථාවට සංශෝධන හතක් සිදු කරන ලදි.
B - 1944 ඇමති මණ්ඩල කෙටුම්පතට බොහෝ දුරට සමාන විය.
C - නෛතික පදනමින් ගත් විට, බ්‍රිතාන්‍ය කැබිනට් ආණ්ඩුක්‍රම ආකෘතිය, පාලන ආකෘතිය ලෙසින් පිළිගන්නා ලදී.
D - මේ යටතේ රාජ්‍ය සේවය සහ අධිකරණ සේවය සම්බන්ධයෙන් ඇති කළ විධිවිධාන ද බ්‍රිතාන්‍ය වෙස්ට්මිනිස්ටර් විධිවිධානවලට ඉතා සමීප සම්බන්ධතාවයක් දක්වයි.
E - මෙමගින් බහුවාර්ගික සමාජයක අවශ්‍යතාවයන් හඳුනා ගත්තේය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

24. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය,

A - වෙස්ට්මිනිස්ටර් රාජාණ්ඩු ක්‍රමය බැහැර කරමින් ලංකාව තුළ සමූහාණ්ඩු ක්‍රමයක් ඇති කළේය.

B - බලතල බෙදීමේ සංකල්පයට වෙනස්ව යමින් මූලධාර්මික වශයෙන් බලතල එක්තැන් කිරීමේ සංකල්පය අනුව ක්‍රියාත්මක විය.

C - පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් ව්‍යවස්ථා අධිකරණය ලබා දුන් ඕනෑම තීරණයක් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට ජාතික රාජ්‍ය සභාවට සිදු විය.

D - පනත් කෙටුම්පතක් නීතියක් බවට පත් කිරීම සඳහා නාමික විධායකයේ අනුමැතිය අවශ්‍ය නොවීය.

E - රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ මූලධර්මය මෙහි නවාංගයක් විය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

25. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

A - ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රථම, නූතන සහ කල්පවත්නා දේශපාලන පක්ෂය ලංකා සම සමාජ පක්ෂයයි.

B - ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතවාදය ජාතිකවාදයේත් තුන්වෙනි ලෝක සමාජවාදයේත් සංකලනයකි.

C - 1960 ගණන්වල මැදදී ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ 'පැරණි වම' සහ 'නව වම' වශයෙන් ධාරා දෙකක් මතු විය.

D - වර්තමානයේ ලංකාවේ ක්‍රියාත්මක වන්නේ ද්වි පක්ෂ ක්‍රමයකි.

E - සන්නද්ධ අරගලයක් මාර්ගයෙන් රාජ්‍ය බලය අත්පත් කරගැනීමට ක්‍රියා කළ එකම වාමාංශික දේශපාලන පක්ෂය ජනතා විමුක්ති පෙරමුණයි.

(1) ABCD (2)ABCE (3)ABDE (4)ACDE (5)BCDE (......)

• අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3),(4) සහ (5) යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 26. | 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් විධායක ජනාධිපතිධුරය හඳුන්වා දෙන ලදී. | 1978 ව්‍යවස්ථාව 1972 ව්‍යවස්ථාව මෙන් සමූහාණ්ඩු මූලධර්මය මත පදනම් නොවේ. | (....) |
| 27. | වර්තමානයේ දී ජනාධිපතිවරයාට සිය තනි අභිමතය පරිදි රාජ්‍ය සේවයේ ඉහළ තනතුරු සඳහා පුද්ගලයන් පත් කළ හැක. | දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ අගමැතිවරයා කිනම් ආකාරයකින් හෝ ධූරය දැරීම අවසන් වූ විටෙක කැබිනට් මණ්ඩලය ද විසිර යන්නේ ය. | (....) |
| 28. | දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ නීතියෙන් පිහිටුවන ලද ඉහළම මුල් අවස්ථා අධිකරණය මහාධිකරණය යි. | පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන අණපනත් සඳහා ජනමත විචාරණයක් කැඳවීමේ බලය ජනාධිපතිවරයාට ලැබෙන්නේ 19 වැනි සංශෝධනය මගිනි. | (....) |
| 29. | 1978 ව්‍යවස්ථාවේ 75 වැනි වගන්තියට අනුව අතීතයට බලපාන ආකාරයේ නීති සම්පාදනය කිරීමට පාර්ලිමේන්තුවට බලය ඇත. | ජනාධිපතිධූරය සඳහා තේරී පත්වීමට අපේක්ෂා කරන්නෙකු වයස අවුරුදු 30 සම්පූර්ණ කර තිබිය යුතුය. | (....) |
| 30. | 19වෙනි සංශෝධනය මගින් ඇති කරන ලද ස්වාධීන කොමිෂන් සභා දෙකක ක්‍රියාකාරීත්වය 20වෙනි සංශෝධනය මගින් අහෝසි කරන ලදී. | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ ජාතික විගණන කොමිෂන් සභාව එම කොමිෂන් සභා දෙකයි. | (....) |

## B කොටස

31. 'දේශපාලනය යනු පෞර රාජ්‍යයට සම්බන්ධ කාරණයක් ය' යන ග්‍රීක අදහසේ අර්ථ දෙකක් පැවතුණි. එම අර්ථ **දෙක** නම් කරන්න
    (1) ..........
    (2) ..........

32. (1) සමාජ ප්‍රජාතන්ත්‍රවාදී චින්තනය හැඩ ගැස් වූ ප්‍රධානතම චින්තකයා නම් කරන්න
    ..........
    (2) තුන්වන ලෝකයේ (Third - World Socialism) සමාජවාදය ඉදිරිපත් කළ ශාස්ත්‍රඥයෙකු නම් කරන්න
    ..........

33. පහත කෘතිවල කතුවරුන් නම් කරන්න.
    (1) නීතියේ සාරය - ..........
    (2) සමාජ ගිවිසුම - ..........

34. සමාජයේ පවත්නා ආයතන ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකිය. එම කොටස් **දෙක** නම් කරන්න.
    (1) ..........
    (2) ..........

35. ගැටුම් සමථන ක්‍රියාවලියේදී **"සාමය උදෙසා න්‍යායපත්‍රය"** (An Agenda for Peace) හා **"ධරණීය සාමය"** (Sustainable Peace) යන සංකල්ප ඉදිරිපත් කරන න්‍යායාචාර්යවරුන් **දෙදෙනා** පිළිවෙලින් නම් කරන්න.
    (1) ..........
    (2) ..........

36. රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීම දෙයාකාර ස්වරූපයක් ගනී. එම ආකාර **දෙක** නම් කරන්න.
    (1) ..........
    (2) ..........

37. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ පාර්ලිමේන්තුවට පරම ව්‍යවස්ථාදායක බලයක් හිමි නොවුණි. ඒ සඳහා බලපෑ කරුණු **දෙකක්** ලියන්න.
    (1) ..........
    (2) ..........

38. ඉන්දියානු ආණ්ඩු ක්‍රමය තුළ අන්තර් ප්‍රාන්ත ගැටුම් නිරාකරණය සඳහා ආයතන දෙකක් පිහිටුවා ඇත. එම ආයතන **දෙක** නම් කරන්න.
    (1) ..........
    (2) ..........

39. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ජනාධිපතිවරයා තෝරාගැනීම සඳහා යොදා ගන්නා මැතිවරණ ක්‍රමය තුළින් ව්‍යවස්ථා සම්පාදකයින් අපේක්ෂා කළ අරමුණු **දෙකක්** නම් කරන්න.
    (1) ..........
    (2) ..........

40. මැක්ස් වෙබර් (Max Weber) විවිධ සමාජවල පවතින අධිකාරි ක්‍රම තුනක් පිළිබඳ සඳහන් කරයි. ඉන් **දෙකක්** ලියන්න
    (1) ..........
    (2) ..........

41. නූතන රාජ්‍යයන් හි විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නා වූ ක්‍රමවේද **දෙකක්** නම් කරන්න.
    (1) ..........
    (2)..........

42. සෝවියට් රුසියාවේ හා චීනයේ සමාජවාදී ආස්ථානය දුර්වල වූයේ කුමන නායකයින්ගේ පාලන කාලවලදී දැ'යි පිළිවෙලින් නම් කරන්න..
    (1) ........................................................................................................................................
    (2) ........................................................................................................................................

43. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ අමාත්‍ය මණ්ඩලය ආකාර දෙකකින් සකස් විය. එම ආකාර **දෙක** නම් කරන්න.
    (1) ........................................................................................................................................
    (2) ........................................................................................................................................

44. ලිබරල් නිරාගමිකවාදයේ මූලධර්ම **දෙකක්** ලියන්න.
    (1) ........................................................................................................................................
    (2) ........................................................................................................................................

45. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කොන්දේසි **දෙකක්** නම් කරන්න.
    (1).......................................................................................................................................
    (2).......................................................................................................................................

46. ශ්‍රී ලංකාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව ගෙන ආ 19වන ව්‍යවස්ථා සංශෝධනය මගින් පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් සිදුකළ වෙනස්කම් **දෙකක්** ලියන්න.
    (1) ........................................................................................................................................
    (2) ........................................................................................................................................

47. නොබැඳි ජාතීන්ගේ සමුළුව හා පොදුරාජ්‍ය මණ්ඩල සමුළුවේ සත්කාරක රාජ්‍යය ලෙස ශ්‍රී ලංකාව කටයුතු කළ වර්ෂ පිළිවෙලින් නම් කරන්න..
    (1).......................................................................................................................................
    (2).......................................................................................................................................

48. ශ්‍රී ලංකාවේ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී නොවන අංග ලක්ෂණ **දෙකක්** නම් කරන්න
    (1).......................................................................................................................................
    (2).......................................................................................................................................

49. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අනුප්‍රාප්තික ජනාධිපතිවරු පත් වූ අවස්ථා දෙකකි. එම ජනාධිපතිවරු පත් වූ වර්ෂයන් සඳහන් කරන්න
    (1) ........................................................................................................................................
    (2) ........................................................................................................................................

50. අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන යටතේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා පිහිටුවාගෙන ඇති සංවිධාන **දෙකක්** නම් කරන්න.
    (1).......................................................................................................................................
    (2).......................................................................................................................................

***

# අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2025
## අනුහුරු ප්‍රශ්න පත්‍රය

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විතය.
* **I** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, **II** කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, **III** කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

### I කොටස

1. දේශපාලන විද්‍යාව යනු, "**රාජ්‍ය, රාජ්‍ය පරිපාලනය හා ආණ්ඩුකරණය පිළිබඳ හදාරන විෂයයි**". පැහැදිලි කරන්න. (ලකුණු 20)

2. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පැහැදිලි කරන්න
   (i). රාජ්‍යයේ භූමිකාව
   (ii). සමාජවාදී රාජ්‍ය
   (iii). නව ලිබරල්වාදී රාජ්‍ය

   (ලකුණු 10×2 = 20)

3. (i). සන්ධීය ආණ්ඩු බිහිවීමට බලපෑ හේතු කෙටියෙන් දක්වන්න (ලකුණු 05)
   (ii). ඒකීය හා සන්ධීය ආණ්ඩු අතර වෙනස පැහැදිලි කරන්න (ලකුණු 15)

### II කොටස

4. යටත් විජිත පාලන අවධිය තුළ බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ නිසා මෙරට තුළ ඇතිවූ සමාජ,ආර්ථික සහ දේශපාලන පරිවර්තන සාකච්ඡා කරන්න.
   (ලකුණු 20)
5. "**සෝල්බරි ව්‍යවස්ථාව වෙස්ට්මිනිස්ටර් ආකෘතියට අනුව සකස් කරන ලද්දකි.**" සාකච්ඡා කරන්න.
   (ලකුණු 20)

6. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත මාතෘකාවලින් ඕනෑම **දෙකක්** තුළනාත්මකව සාකච්ඡා කරන්න.

   (i). පාර්ලිමේන්තු පරමාධිපත්‍යය

   (ii). අධිකරණයේ ස්වාධීනත්වය.

   (iii). රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය

   (iv). නාමික විධායකය (ලකුණු 10×2 = 20)

7. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත මාතෘකාවලින් ඕනෑම **දෙකක්** සාකච්ඡා කරන්න.

   (i). ජනාධිපතිවරයා, නීති සම්පාදන ක්‍රියාවලිය සහ පාර්ලිමේන්තුව

   (ii). මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය.

   (iii). විධායකය සහ රාජ්‍ය සේවය

   (iv). පාර්ලිමේන්තුව (ලකුණු 10×2 = 20)

## III කොටස

8. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පැහැදිලි කරන්න

   (i). ඇමෙරිකානු ආණ්ඩු ක්‍රමයේ සාමාන්‍ය ලක්ෂණ

   (ii). ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ පදනම

   (iii). ප්‍රංශ ආණ්ඩු ක්‍රමයේ පරිපාලන බලය විමධ්‍යගත කිරීම

   (ලකුණු 10×2 = 20)

9. (i). ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හැඩගැස්වීම කෙරෙහි බලපාන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 10)
   (ii). අන්තර්ජාතික දේශපාලනයේ සමකාලීන ප්‍රවණතා සැකෙවින් විස්තර කරන්න (ලකුණු 10)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

   (i). නිරාගමිකවාදය

   (ii). ගැටුම් ජීවන චක්‍රය

   (iii). දේශපාලන පක්ෂවල කාර්යයන්

   (iv). බලතල බෙදීම

   (v). රාජ්‍ය ප්‍රතිපත්ති හා අධිකරණය (ලකුණු 10×2 = 20)

# අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

## දේශපාලන විද්‍යාව අනුහුරු පිළිතුරු පත්‍රය - 2025

**1 පත්‍රය**

**A කොටස**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|
| 01 | **4** | 11 | **1** | 21 | **1** |
| 02 | **5** | 12 | **4** | 22 | **1** |
| 03 | **5** | 13 | **4** | 23 | **5** |
| 04 | **3** | 14 | **2** | 24 | **3** |
| 05 | **2** | 15 | **4** | 25 | **2** |
| 06 | **4** | 16 | **1** | 26 | **4** |
| 07 | **1** | 17 | **5** | 27 | **3** |
| 08 | **3** | 18 | **2** | 28 | **2** |
| 09 | **5** | 19 | **1** | 29 | **1** |
| 10 | **3** | 20 | **4** | 30 | **5** |

**B කොටස**

31. 1. රාජ්‍ය හා රාජ්‍ය පාලනයට සම්බන්ධ කාරණා
2. රාජ්‍ය කටයුතු සම්බන්ධව පුරවැසියන්ගේ කාර්යභාරය හා ක්‍රියාකාරීත්වය

32. 1. එඩ්වර්ඩ් බර්න්ස්ටයින්
2. ජවහර්ලාල් නේරු/අබ්දුල් ගමාල් නසාර්/ජූලියස් නියරේරේ

33. 1. චාල්ස් මොන්ටෙස්ක්‍යු
2. ෂෝන් ෂාක් රුසෝ

34. 1. විධිමත් ආයතන
2. අවිධිමත් ආයතන

35. 1. බුත්‍රෝස් බුත්‍රෝස්ගාලි
2. ජොහාන් ගැල්ටුං

36. 1. ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කරන හැදෑරීම
2. ප්‍රතිපත්තිය තුළ කරන හැදෑරීම

37. 1. 29(2) වන වගන්තිය සංශෝධනය කිරීමට හෝ අහෝසි කිරීමට හෝ බලය පාර්ලිමේන්තුවට නොතිබීම.
2. යම් පනතක් ව්‍යවස්ථාවට අනුකූල නොවේ නම් එය බල රහිත කිරීමේ බලය අප්‍රකාශිතව අධිකරණයට තිබීම.
3. 1947 ලංකා ස්වාධීනතා පනත අනුව ලංකාවේ ඉල්ලීම හා කැමැත්ත මත ලංකාව වෙනුවෙන් නීති පැනවීමේ බලය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සතු වීම... ආදී

38. 1.ශ්‍රේෂ්ඨාධිකරණය
2. අන්තර් ප්‍රාන්ත කවුන්සිලය

39. 1. ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීමේ දී සුළුතර කණ්ඩායම්වලට අර්ථාන්විත භූමිකාවක් තිබිය යුතු වීම.
2. ඡන්දදායකයන්ගෙන් නියත බහුතරයකගේ සහාය තෝරාපත් කරගනු ලබන ජනාධිපතිවරයාට තිබිය යුතු වීම.

40. 1. සාම්ප්‍රදායික අධිකාරි ක්‍රමය.
2. අනුහස් හෙවත් කැරිස්මා අධිකාරි ක්‍රමය.
3. නෛතික තාර්කික අධිකාරිය ක්‍රමය.

41. 1 රාජ්‍ය තාන්ත්‍රික සබඳතා
2. විදේශාධාර
3. මිලිටරි බලය

42. 1. මිහායිල් ගොර්බචෝප්
2. ඩෙන් ෂියාඕපිං

43. 1. රාජ්‍ය නිළධාරීන් තිදෙනා
2. විධායක කාරක සභා සභාපතිවරු 07 දෙනා (දේශිය අමාත්‍යවරු 07)

44. 1. රාජ්‍යය සහ පල්ලිය ආයතනික වශයෙන් වෙන් කිරීම.
2. රාජ්‍යය ආගම, සමඟ අනන්‍ය නොවීම සහ ආගමික අධ්‍යයනයට හා ප්‍රචාරණයට රාජ්‍යය සම්බන්ධ නොවීම.
3. රාජ්‍ය කිසි ම ආගමකට පක්ෂපාතිත්වයක් නොමැති විය යුතු වීම.
4. ආගමික නිදහස පුරවැසි මූලික අයිතිවාසිකමක් වන අතර ආගමිකත්වය මත කිසි දු පුරවැසියකුට වෙනස්කමක් නොකළ යුතු වීම... ආදී

45. 1. නන්වැදෑරුම් නිදහස.
2. සමානාත්මතාව.
3. බහුතරයේ පාලනය./මහජන පාලනය./ව්‍යවස්ථානුකූල වාදය./නීතියේ ආධිපත්‍යය./අධිකරණයේ ස්වාධීනත්වය./වගකීම සහිත ආණ්ඩුව./නිදහස් මැතිවරණය./තරගකාරී දේශපාලන පක්ෂ ක්‍රමය

46. 1. පාර්ලිමේන්තුවේ නිල කාලය වසර 6 සිට 5 දක්වා අඩු කිරීම
2. ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ මහ මැතිවරණයකින් පසුව පාර්ලිමේන්තුව ප්‍රථම වරට රැස් වන දින සිට වසර හතර හමාරක් ඉක්ම වීමෙන් පසුව වීම....ආදී

47. 1. 1976
2. 2013

48. 1. විධායක ජනාධිපති ක්‍රමය සහ ජනාධිපතිවරයා වෙත රාජ්‍ය බලය අතිශයින් කේන්ද්‍රගත වීම
2. ව්‍යවස්ථාදායකය සහ අධිකරණය විධායකයේ බලපෑම යටතට ගෙන ඒම
3. දේශපාලන ප්‍රචණ්ඩත්වය සහ සිවිල් යුද්ධය
4. නිදහස් සහ සාධාරණ මැතිවරණ මූලධර්මය උල්ලංඝණය කිරීම
5. රාජ්‍යය සහ සිවිල් සමාජය යුධමයකරණයට පාත්‍ර වීම
6. හදිසි නීතිය සහ ඒ යටතේ මූලික අයිතිවාසිකම් අත් හිටුවීම
7. මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම්
8. ආණ්ඩුකරණ ක්‍රියාවලිය තුළ සිදුවන දූෂණය සහ බලය අවභාවිත කිරීම

49. 1. 1993
2. 2022

50. 1. බ්‍රෙට්න්වුඩ්ස් සංවිධාන ජාලය,
2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
3. ලෝක බැංකු සංවිධාන ජාලය

## 11 පත්‍රය පිළිතුරු

01. දේශපාලන විද්‍යාව යනු, **"රාජ්‍ය, රාජ්‍ය පරිපාලනය හා ආණ්ඩුකරණය පිළිබඳ හදාරන විෂයයි"**. පැහැදිලි කරන්න **(ලකුණු 20)**

මෙම පිළිතුරෙන් අපේක්ෂා කරන්නේ දේශපාලන විද්‍යාව රාජ්‍ය, රාජ්‍ය පරිපාලනය පිළිබඳ හදාරන්නක් බව විස්තර කිරීමයි.

- දේශපාලන විද්‍යාව යනු අප සැමදෙනාගේම ජීවිතයේ ප්‍රධාන පැතිකඩක් වන දේශපාලනය පිළිබඳව වන පැතිකඩ ශාස්ත්‍රීය ලෙස හැදෑරීමයි.
- දේශපාලන විද්‍යාව ශාස්ත්‍රීය ලෙස හැදෑරීම ආරම්භ වන්නේ ක්‍රිස්තු පූර්ව හතරවන සියවසේ ග්‍රීසියේ ඇතැන්ස් නුවර කේන්ද්‍ර කරගෙනය.
- දේශපාලන විද්‍යාව යනු කුමක්දැ යි හඳුනා ගැනීමේ දී මූලික කරුණු කිහිපයක් වැදගත් වේ.
    - දේශපාලන විද්‍යාව යනු පැරණිතම ශාස්ත්‍රීය ශික්ෂණයකි
    - දේශපාලන විද්‍යාවේ න්‍යාය, සංකල්ප හා විධික්‍රම වසර 2500ක් පැරණිය.
    - දේශපාලන විද්‍යාවේ න්‍යාය, සංකල්ප හා විධික්‍රම බහුවිධ වේ.
- දේශපාලනය හා දේශපාලන විද්‍යාව වඩා හොඳින් පැහැදිලි කර ගැනීමේ දී ප්‍රධාන අර්ථකථන දෙකක් උපයෝගී කරගතහැකිය.
- දේශපාලන විද්‍යාව යනු රාජ්‍ය රාජ්‍ය පරිපාලනය ආණ්ඩුකරණය පිළිබඳ හදාරන විෂයයි
- රජයෙන් පරිබාහිරව පුරවැසියන් සහභාගි වන සමාජ භාවිතයකි.
  (මෙහිදී රාජ්‍ය රාජ්‍ය පරිපාලනය ආණ්ඩුකරණය පිළිබඳ හදාරන සංකල්පයක් බව විස්තර කළ යුතුය)
- දේශපාලන විද්‍යාවේ ස්වභාවය පිළිබඳව පවතින පැරණිතම අදහසයි
- මෙම අදහස මුලින්ම ඉදිරිපත් කර ඇත්තේ ග්‍රීක ජාතික ඇරිස්ටෝටල්ය
- ඇරිස්ටෝටල් සිය Politics කෘතියෙහි දේශපාලන විද්‍යාව රාජ්‍ය පිළිබඳ හදාරන විද්‍යාවක් බව ප්‍රකාශ කර ඇත.
- ග්‍රීසිය තුළ පමණක් නොව සමකාලීන ඉන්දියාවේ හා චීනය තුළද දේශපාලන විද්‍යාව රාජ්‍ය පිළිබඳ හදාරන්නක් බව සඳහන් කර ඇත.
- ග්‍රීක යුගයෙන් පසු රෝම, මධ්‍යතන යුගයන්හි ද දේශපාලන විද්‍යාව රාජ්‍ය පිළිබඳ හදාරන්නක් බව ප්‍රකාශ කර ඇත.
- දේශපාලන විද්‍යාව තුළ රාජ්‍ය පිළිබඳව හැදෑරීමේදී තේමා කිහිපයක් අධ්‍යනය කරනු ලබයි.
- රාජ්‍යය ආරම්භය, රාජ්‍යයේ අරමුණු, රාජ්‍යයේ ස්වභාවය, රාජ්‍යයේ බලය, රාජ්‍යය හා මිනිසා අතර ඇති සම්බන්ධය, රාජ්‍ය පාලන ක්‍රම, පාලකයන්ගේ ගතිගුණ සහ කුසලතා.
- රාජ්‍යයේ ආරම්භය පිළිබඳව කෙටියෙන් සඳහන් කළ හැකිය.
- රාජ්‍ය බිහිවූ පසු එහි ප්‍රායෝගික ක්‍රියාකාරී ආයතනය වන ආණ්ඩුව පිළිබඳව හැදෑරීමකට ලක් කරන බව විස්තර කරන්න.
- ආණ්ඩුවේ ප්‍රධාන ආයතන වන ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන ආයතන ද හදාරන බව පැහැදිලි කළ යුතුය.
- ඉන්පසු රාජ්‍ය පරිපාලනය නැමැති ක්ෂේත්‍රය ද දේශපාලන විද්‍යාවේ දී හැදෑරීමකට ලක් කරන බව සඳහන් කළ යුතුය.

02. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පැහැදිලි කරන්න

(i). රාජ්‍යයේ භූමිකාව

(ii). සමාජවාදී රාජ්‍ය

(iii). නව ලිබරල්වාදී රාජ්‍ය

**(i). රාජ්‍යයේ භූමිකාව** **(ලකුණු 10)**

- රාජ්‍යය යනු සමාජයක් පාලනය කිරීමට නිර්මාණය වූ බල ව්‍යූහවලත්, ආයතනවලත්, එකතුව ලෙස අර්ථ දැක්විය හැකි ය.
- රාජ්‍යයේ කාර්යයන් සාම්ප්‍රදායික ව තේරුම් ගෙන ඇත්තේ, ප්‍රධාන කාර්ය ක්ෂේත්‍ර තුනක් ආශ්‍රය කරගෙන යි. ඒවා,
  - ව්‍යවස්ථාදායකය - එනම් නීති සම්පාදනය.
  - විධායකය - එනම් නීති ක්‍රියාත්මක කරවීම.
  - අධිකරණය - එනම් යුක්තිය පසිඳලීම.
- මේ වර්ගීකරණය "රාජ්‍යය" යන්න තේරුම් ගැනීමට අපට ප්‍රයෝජනවත් වුවත්, රාජ්‍යයේ කාර්යභාරය ඊට වඩා පුළුල් සහ සංකීර්ණ වේ.
- රාජ්‍යයේ කාර්යය භාර්යය වර්තමානය වන විට පුළුල් හා සංකීර්ණ වේ. ඒ අනුව සමකාලීන ලෝකයේ රාජ්‍ය විසින් සිදු කරනු ලබන කාර්යයන් පහත දැක්වේ.

**1.නීතියේ සමාජ පර්යායේ හා දේපළවල භාරකාරත්වය**

රාජ්‍යයේ කාර්යයන් පිළිබඳ අධ්‍යනය කිරීමේදී පැරණිතම කාර්යය වන්නේ මෙයයි. එහිදී රාජ්‍ය විසින් සුපරික්ෂාව, යුක්තිය පසිඳලීම, අධිකරණ කටයුතු මෙහෙයවීම හා දඬුවම් ලබා දීම,නීති සම්පාදනය හා අර්ථකතනය, ප්‍රතිපත්ති සම්පාදනය සිදු කරයි.

**2.ආර්ථික පරිපාලනය හා මෙහෙයවීම.**

සමස්ත රාජ්‍යයේම ආර්ථික කටයුතු මෙහෙය වීමේ තනි බලය රාජ්‍යය සතු වේ. එහිදී බදු එකතු කිරීම, රටේ ආර්ථික ගමන් මග තීරණය කිරීම හා ආර්ථික ප්‍රතිපත්ති සැකසීම සිදු කරයි.

**3.සමාජ පාලනය, මෙහෙයවීම හා අධීක්ෂණය.**

මෙ යටතේ ආදායම් බෙදීයාමේ රටා තීරණය කිරීම සහ පාලනය කිරීම, ආර්ථික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතීන් තීරණය කිරීම, සමාජ ආරක්ෂාව හා සුබසාධන, දිළිඳු සහන ප්‍රතිපත්ති, නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපන, ගමනාගමන ආදී ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති තීරණය කිරීම සිදු කරයි.

**4.සමාජයේ නීතිය හා සාමය පවත්වාගෙන යාම.**

රාජ්‍ය දේශ සීමා ඇතුලත නීතිය හා සාමය පවත්වා ගනිමින් පුරවැසියන් රාජ්‍යයේ ආධිපත්‍ය බලයට අවනත කිරීම සඳහා රාජ්‍ය නිරන්තරයෙන් උත්සාහ ගනී. ඒ සඳහා අධිකාරී බලයද, ආයතනද,පි රිස් බලයද රාජ්‍ය සතුය.පොලිසිය, අධිකරණය සහ පිරිස් බලය පවත්වා ගැනීමත්, පුරවැසි සෝදිසිය හා සුපරික්ෂාකාරීත්වයෙන් නීතිය හා සාමය පවත්වා ගැනීමට රාජ්‍ය සතු ආයතන සහ භාවිතයන්ය.

**5.යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම.**

රාජ්‍යට පමණක් ආවේණික කාර්යයක් ලෙස මෙය සැලකේ රාජ්‍ය අභ්‍යන්තර මෙන්ම බාහිර යුද්ධවලට සම්බන්ධ වේ. අභ්‍යන්තර යුද්ධ අවශ්‍යවන්නේ රාජ්‍යයේ ආරක්ෂාවට, දේශසීමා ඇතුළතින් එල්ලවන තර්ජන මැඩ පැවැත්වීමටය. රාජ්‍යක් බාහිර යුද්ධවල එළඹෙන්නේ රාජ්‍යයේ ආරක්ෂාවට වෙනත් රාජ්‍යන්වලින් එල්ල වන යුධ තර්ජනවලින් බේරීමටය.

**6.අන්තර්ජාතික සබඳතා පැවැත්වීම.**

රාජ්‍ය සතු වැදගත් කාර්යයක් වන්නේ වෙනත් රාජ්‍යන් සමඟ සබඳතා පැවැත්වීමයි. රාජ්‍යට තනිව තම අවශ්‍යතාවයන් ඉටු කරගත නොහැකි නිසා ද්විපාර්ශවික, බහු පාර්ශවික වශයෙන් රාජ්‍ය සබඳතා පවත්වයි.

**(ii). සමාජවාදී රාජ්‍ය** **(ලකුණු 10)**

- මාක්ස්වාදී දේශපාලන චින්තනය ඇසුරින් ගොඩනැගුනු සමාජවාදී රාජ්‍ය මාදිලිය පිළිබඳ සංකල්පය 19 වන සියවසේ ආරම්භ වී 20 වන සියවසේ වර්ධනය වූ රාජ්‍ය මාදිලියකි.
- මෙම මතවාදය ඉදිරිපත් වීම සිදු වූයේ යුරෝපයේ වර්ධනය වී තිබුණ ධනවාදී හා ලිබරල් රාජ්‍ය මාදිලියට විකල්පයක් වශයෙනි. එයට හේතුව වන්නේ , ලිබරල්වාදය තුළ බහුතරයක් ප්‍රජාව පීඩාවට පත් වීමයි. එනම් ව්‍යාපාරිකයන් තමන්ට රිසි සේ ධනය උපයමින් ,ශ්‍රමය සූරා කමින් නිර්ධන පන්තිය පීඩාවට පත් කිරීමයි.

- එම ක්‍රියාවලිය තුළ සමාජවාදී අදහස් මාලාවක් ඉදිරිපත් වූයේ 19 වන සියවසේදී මාක්ස්වාදී දර්ශනය පදනම කරගෙනය. ජර්මන් ජාතික කාල්මාක්ස් හා ෆෙඩ්රික් එංගල්ස් "කොමියුනිට්ස්" ප්‍රකාශනය කෘතිය රචනා කරමින් ගොඩනැගූ න්‍යායික දර්ශනය මෙම රාජ්‍ය මාදිලියේ ප්‍රධාන අදහස බවට පත්ව තිබේ.
- කාල්මාක්ස් තම මතවාදය ඉදිරිපත් කිරීමේදී ගුරුවරයා වූ හෙගල් සහ මිතුරා වූ ෆෙඩ්රික් එංගලස්ගේ සහාය ලබාගෙන ඇත. මෙම සමාජවාදී චින්තනයේ මූලික අදහස වන්නේ ,

  "ධනවාදී සමාජ , ආර්ථික , දේශපාලන ක්‍රමය කම්කරු පන්තිය විසින් පෙරලා දමා ශ්‍රම සූරා කෑමෙන් තොර සමාජය තුළ පන්ති විභේදනයක් නැති සමානාත්මතාව අගයන සමාජයක් ගොඩ නැගීමය.

- ඒ අනුව සමාජවාදී රාජ්‍යයකදී වැඩි වශයෙන් අවධානය යොමු කරන්නේ, පුරවැසියාගේ " භෞතික ජීවන තත්ත්වය " වර්ධනය කිරීම සඳහා ය.
- අධ්‍යාපනය, රැකියාව ,නිවාස , සෞඛ්‍යය , ආදී මූලික මනුෂ්‍ය අවශ්‍යතා සෑම දෙනෙකුටම සමානව සැපයීම සමාජවාදී රාජ්‍යයක වගකීමක් ලෙස සැලකුණි.
- ඒ වෙනුවෙන් පෞද්ගලික ව්‍යවසාය වෙනුවට රාජ්‍ය ආධිපත්‍යය ස්ථාපනය කරයි.
- ඒ සඳහා යුග 5ක් පසු කරමින් කම්කරු පන්ති ආඥා දායකත්වයක් යටතේ ආර්ථික සම්පත් හා නිෂ්පාදන ක්‍රියාවලියේ පෞද්ගලික අයිතිය අහෝසි කොට සමාජයේ පොදු අධිකාරිය ස්ථාපනය කරයි.
- විවිධ පන්ති හැගීම සමාජය තුළින් තුරන් වී යන අතර පන්ති අසමානතාවය ද අහෝසි වී යන බව කියැවේ.
- කාල්මාක්ස් විසින් ඉදිරිපත් කළ පන්ති සහිත සෑම සමාජ ක්‍රමයක් තුළම රාජ්‍ය පැවතුණි. වහල් , වැඩවසම්, ධනවාදී ,සමාජවාදී යුගයක් තුළ රාජ්‍ය පන්තියක ආයුධයක් ලෙස බහුතරයක් වූ ප්‍රජාව පීඩාවට පත් කරන ලදී.
- සමාජවාදී යුගය තුළ ද රාජ්‍ය පැවති අතර , එය පවත්වාගෙන යනු ලැබුවේ , ධනවාදී අදහස් සමාජයෙන් තුරන් කිරීම සඳහා ය.
- නමුත් රාජ්‍ය නැමැති මර්දනකාරී ආයතනය තවදුරටත් අවශ්‍ය නොවන බැවින් උත්තරීතර කොමියුනිස්ට් යුගයේදී එය වියැකී යන බව මාක්ස්වාදී අදහසින් ප්‍රකාශ වේ.
- ඒ සමගම රාජ්‍යයට නීතියේ අවශ්‍යතාවය ද පැන නොනගී. ඒ අනුව පැහැදිලි වන්නේ , ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය හා සසඳන කල සමාජවාදී රාජ්‍ය ක්‍රමය හාත්පසින් වෙනස් බවයි.
- සමාජවාදී ක්‍රමය තුළ පාලන හිමිකරුවන් වන්නේ කම්කරු පන්තියයි. මෙකී පාලනයේ පදනම වන්නේ නිර්ධන පන්ති ආඥා දායකත්වයයි. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ බහු පක්ෂ ක්‍රමයක් පැවතිය ද සමාජවාදී පාලන ක්‍රමයක් තුළ පවතින්නේ ඒක පක්ෂ ක්‍රමයකි.
- ලෝකයේ සමාජවාදී රාජ්‍ය ක්‍රමය අත්හදා බැලූ රාජ්‍යයන් කිහිපයක් ද පැවති ඒ අතර සෝවියට් රුසියාව ,චීනය, කියුබාව , උ. කොරියාව ,වියට්නාමය ,කාම්බෝජය වැනි රටවල් දැක්විය හැකි ය.
- නමුත් පසු කාලීනව සමාජවාදී ක්‍රමය බිඳ වැටීමත් සමඟ තවදුරටත් සමාජවාදී රාජ්‍ය ලිබරල්වාදයට විකල්පයක් නොවනු ඇත.

**(iii). නව ලිබරල්වාදී රාජ්‍ය** **(ලකුණු 10)**

ලිබරල්වාදය ප්‍රධාන කොටස් තුනකි.

  - සම්භාව්‍ය ලිබරල්වාදය
  - පශ්චාත් සම්භාව්‍ය ලිබරල්වාදය
  - නව ලිබරල්වාදය

- රාජ්‍ය සුභසාධන සංකල්පය තුන් වන ලෝකයෙන් ගිලිහී යාම ආරම්භ වීමත්, සමාජවාදය ලෝක පරිහානියට පත්වීමත් නිසා ලෝක ධනවාදී ආර්ථික හා දේශපාලන බලවේගයන්ට ලොව පුරා නිරුපද්‍රිත ව තහවුරු වීමට අවකාශය සැලසිණි.
- එම පසුබිමේ ජාතික රාජ්‍යයේ දේශසීමාව ඉක්මවා වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය ශීඝ්‍ර ව්‍යාප්තියකට ලක් විය.
- මෙම මූල්‍ය ප්‍රාග්ධනය මුල්කරගත් ධනේශ්වර වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය අන්තර්ජාතික වශයෙන් ක්‍රියාත්මක වීම හේතු කරගෙන ‘‘ගෝලීයකරණය’’ සංකල්පය බිහි විය.

- 1960 දශකය වන විට රාජ්‍ය සුභසාධන වාදය ක්‍රමයෙන් අවලංගු වී කළමනාකාරී රාජ්‍ය සංකල්පය පැතිරිණ.
- මෙසේ ලිබරල් රාජ්‍ය ආණ්ඩු පාලනයට පමණක් සීමා කිරීම නව ලිබරල් රාජ්‍යයේ මූලික ලක්ෂණයක් විය.
- ධනවාදී වෙළෙඳපොළ ආර්ථිකය ජගත්කරණයට බඳුන් වීම නිසා ලෝකයේ දේශපාලන සන්දර්භය ප්‍රබල වෙනසකට ලක් විය.
- මෙවැනි තත්ත්වයක් අනුව ජාතික රාජ්‍යය හුදෙක් ම නාම මාත්‍රික භාවයට පත් වීමත්, රාජ්‍ය ආර්ථික කටයුතුවලින් විනිර්මුක්ත වීමත් අනිවාර්ය අංගයක් විය.
- රාජ්‍යය දේශ සීමා ඉක්මවා ව්‍යාප්ත වී ඇත. වෙළෙඳපොළ හැසිරවීම සඳහා කිසි දු ප්‍රයත්නයක් දැරීමට රාජ්‍යයට අවකාශයක් නොමැත.
- මෙවැනි පසුබිමක රාජ්‍යයට පැවරී ඇති කාර්යය වන්නේ නිදහස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට අවශ්‍ය සාමකාමී පරිසරයක් ස්ථාපිත කිරීම, යුක්තිය පසිඳලීම සහ කළමනාකරණය යි.
- මෙහි දී කළමනාකරණය යනුවෙන් අදහස් කළේ ධනවාදී වෙළෙඳපොළ ආර්ථිකය යථා පරිදි පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය සියලු ආකාරයේ තත්ත්වයන් සම්පාදනය කිරීම සහ මෙහෙයවීම මුල් කරගත් කළමනාකරණය යි.
- නව ලිබරල්වාදී අදහස් පළ කළ දේශපාලන චින්තකයන් අතරින් රොබට් නෝසික්, ෆෙඩ්රික් වෝන් හයෙක් වැන්නෝ ප්‍රධාන වෙති.
- රාජ්‍යයේ බලය පොලිස් බලයකට වැඩි යමක් නොවිය යුතු ය. පුද්ගලයාගේ දේපළ පිළිබඳ අයිතිය වඩාත් වැදගත් වනවා මෙන් ම එම අයිතිය නොකෙලෙසිය යුතු බව ද ඔහු පෙන්වා දෙයි.
- දිළින්දන් වෙනුවෙන් යෝජනා කරන විසඳුම වන්නේ, රාජ්‍ය නොවන සංවිධාන මඟින් සහනාධාර ලබාදීමේ ක්‍රියා පිළිවෙත යි.
- මේ අනුව අන්තර්ජාතික අධිරාජ්‍යවාදයෙන් ආධාර ලබන රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් ලෝකය තුළ ක්‍රියාත්මක වනු දැකිය හැකි ය.
- මෙය සුභසාධක රාජ්‍යයේ තරම් පුළුල් හා පහසු මැදිහත් වීමක් නොවේ. ඒ අනුව රාජ්‍ය නිර්බාධවාදය හා සුභසාධන වාදය යන දෙකට අතරමැදි තත්ත්වයක් ලෙස අවම රාජ්‍යය හඳුනා ගත හැකි ය.

**03. I. සන්ධීය ආණ්ඩු බිහිවීමට බලපෑ හේතු කෙටියෙන් දක්වන්න (ලකුණු 05)**

- පෙර ස්වාධීනව පැවති රාජ්‍යයන් හෝ දේශපාලන ඒකක හෝ එක් රාජ්‍යයක් වශයෙන් ඒකරාශී වීමේ අවශ්‍යතාවය
- බාහිර තර්ජනයකට මුහුණදීම සඳහා
- අන්තර්ජාතික සම්බන්ධතා මනාව කළමනාකරණය කිරීම වෙනුවෙන්
- ආර්ථික සංවර්ධනය අත්පත් කර ගැනීම සඳහා
- භූමියේ විශාලත්වය නිසා තනි රාජ්‍යයක් ලෙස පාලනය කිරීමේ අපහසුව
- සංස්කෘතික හා වාර්ගික විවිධත්වය මත ( ඉහත කරුණු කෙටියෙන් පැහැදිළි විය යුතුය.)

II. **ඒකීය හා සන්ධිය ආණ්ඩු අතර වෙනස පැහැදිලි කරන්න (ලකුණු 15)**

රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය බෙදීම නැතිනම් ස්වාධිපත්‍ය බලයේ ස්ථානගත වන්නේ කොතැනද යන්න මත ආණ්ඩුක්‍රම වර්ග කිරීම හඳුනාගතත හැකිය. එහිදී ලෝකයේ පවතින ජනප්‍රියම ආණ්ඩුක්‍රම විශේෂයන් ලෙස ඒකීය හා සංධීය ආණ්ඩුක්‍රම හඳුනාගත හැකිය. ස්වාධිපත්‍ය බලය මුළුමනින්ම රැඳී පවතින්නේ මධ්‍යම ආණ්ඩුව මත නම් එවැනි ආණ්ඩුක්‍රම ඒකීය ආණ්ඩුක්‍රම ලෙස හඳුනා ගනී. ශ්‍රී ලංකාව, මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය වැනි රාජ්‍යයන්හි ඒකීය ආණ්ඩුක්‍රම දැක ගත හැකිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ස්වාධිපත්‍ය බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු වෙත බෙදා ඇති ආණ්ඩු සන්ධිය ආණ්ඩු ලෙස හඳුන්වයි. ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, බෙල්ජියම වැනි රාජ්‍යයන්හි සන්ධිය ආණ්ඩු ක්‍රියාත්මක වේ. ඒකීය හා සන්ධිය ආණ්ඩු ක්‍රමයන්හි

වෙනස පහත පරිදි හදුනාගත හැකිය. (මුලින් කෙටි හැදින්වීමක් කර පිළිතුර සංසන්දනාත්මකව විස්තර කර තිබිය යුතුය)

| ඒකීය ආණ්ඩුක්‍රමවල ලක්ෂණ | සන්ධීය ආණ්ඩුක්‍රමවල ලක්ෂණ |
|---|---|
| 1.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින්ම ස්වාධිපති බලය තනි මධ්‍යම ආණ්ඩුවක් වෙත කේන්ද්‍රගත කර තිබේ. | 1.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් මධ්‍යම ආණ්ඩුවට හා ප්‍රාන්ත ආණ්ඩුවලට ස්වාධිපති බලය බෙදීම |
| 2.ශ්‍රී ලංකාව,ප්‍රංශය,බ්‍රිතාන්‍ය,ඉතාලිය,ස්පාඤ්ඤය මෙයට උදාහරණ වේ. | 2.ඇමරිකාව,ඕස්ට්‍රේලියාව,ස්විට්සර්ලන්තය,බෙල්ජියම මෙයට උදාහරණ වේ. |
| 3.මධ්‍යම ආණ්ඩුව විසින් සම්මත කරන ලද පනතක් හරහා ප්‍රාදේශීය ආණ්ඩු වෙත බලය විමධ්‍යගත කර ඇත. | 3.ආණ්ඩුක්‍රම ව්‍යවථාව මඟින් මධ්‍යම ආණ්ඩුවට හා ප්‍රාන්ත ආණ්ඩු වෙත බලය බෙදා දී ඇත. |
| 4.ප්‍රාදේශීය ඒකක වෙත පවරා දුන් බලය ඕනෑම අවස්ථාවක සංශෝධනය කිරීමටත් අහෝසි කිරීමටත් මධ්‍යම ආණ්ඩුවට හැකියාව ඇත. | 4.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු යන දෙකටම බෙදා දෙන බැවින් ප්‍රාන්ත ආණ්ඩුවල බලය ස්වාධීන වේ. මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්ත ආණ්ඩුවල බලය අහෝසි කිරීමට නොහැක. |
| 5.භූමියෙන් කුඩා, ජන ගහනය අඩු රටවලට යෝග්‍ය වේ. | 5.භූමියෙන් විශාල, රටවලට යෝග්‍ය වේ. |
| 6.ජන වාර්ගික බෙදීම් අඩු රටවලට යෝග්‍ය වේ. | 6.ජන වාර්ගික බෙදීම් වැඩි රටවලට යෝග්‍ය වේ. |
| 7.අනෙක් ආණ්ඩු වලට සාපේක්ෂව සරල හා කාර්යක්ෂම ආණ්ඩු ක්‍රමයකි. | 7.සංකීර්ණ හා අකාර්යක්ෂම ආණ්ඩු ක්‍රමයකි. |
| 8.තනි මධ්‍යම ආණ්ඩුවක් මඟින් රාජ්‍ය පාලන කටයුතු පවත්වාගෙන යයි. | 8.මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුවල එකතුවෙන් රාජ්‍ය පාලන කටයුතු පවත්වාගෙන යයි. |
| 9.හදිසි හා අර්බුදකාරී අවස්ථාවන්ට ඉතා හොඳින් මුහුණ දීමේ හැකියාව පවතී. | 9.හදිසි හා අර්බුදකාරී අවස්ථාවන්ට ඉතා හොඳින් මුහුණ දීමේ හැකියාවක් නොමැත. |
| 10.මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය බොහෝ විට ඒක මාණ්ඩලික වේ. | 10.මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු ලෙස මණ්ඩල 2ක් පවතී. |
| 11.ඒකීය පුරවැසිභාවයක් හිමිය. | 11.ද්විත්ව පුරවැසි භාවයක් හිමිය. |
| 12.සාර්ථක විදේශ ප්‍රපත්තියක් ක්‍රියාත්මක කළ හැක. | 12.සාර්ථක විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අපහසුය. |
| 13.මධ්‍යම ආණ්ඩුවේ බලය ප්‍රාදේශීය ඒකක වලට සංවරණය කල නොහැකි නිසා ප්‍රජාතන්ත්‍රවාදය දූර්වල වේ. | 13.මධ්‍යම ආණ්ඩුවේ බලය ප්‍රාන්ත ආණ්ඩුවලට පාලනය කල හැකි නිසා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වේ. |
| 14.සාපේක්ශ වශයෙන් කුඩා රාජ්‍යක් වන නිසා අන්තර්ජාතික වශයෙන් එල්ල වන බලපෑම් වැඩිය. | 14.ප්‍රදේශ ගණනාවක් එකට එකතු කර විශාල ප්‍රමාණයේ සන්ධීය රාජ්‍යක් ගොඩනැගෙන නිසා එවැනි රාජ්‍යන්ට අන්තර්ජාතික වශයෙන් ලැබෙන පිළිගැනීම හා ආරක්ශාව වැඩිය. |
| 15.භූමියෙන් කුඩා වීම නිසා ලැබෙන භෞතික සම්පත් ප්‍රමාණය අඩුය. | 15.භූමිය විශාල වීම නිසා භෞතික සම්පත් විශාල ප්‍රමාණයක් ලැබෙයි. |

| | |
|---|---|
| 16.ඒකීය ආණ්ඩු ක්‍රමයක ජන වර්ග අතර ගැටුම් ඇතිවිය හැක. | 16.සාපේක්ශ වශයෙන් ජන වර්ග අතර ගැටුම් ඇති වීම අඩුය. |
| 17.එක් මධ්‍යම ආණ්ඩුවක් පමණක් පාලන කටයුතු සිදු කරන නිසා පාලන වියදම් අඩුය. | 17.ආණ්ඩු මට්ටම් දෙකක් පවතින නිසා පාලන වියදම් වැඩිය. |
| 18.තනි මධ්‍යම ආණ්ඩුවක් පවතින නිසා දේශපාලන බලය ස්ථාවරය. | 18.ආණ්ඩු මට්ටම් දෙකක් පවතින නිසා දේශපාලන බලය අස්ථාවරය. |
| 19.සියලු බලතල ක්‍රියාත්මක කිරීමේ බලය ඇත්තේ මධ්‍යම ආණ්ඩුවටය | 19.ජාතික මට්ටමේ බලතල ලෙස සැලකෙන ජාතික ආරක්ෂාව,මුදල්,විදේශ කටයුතු වැනි වැදගත් බලතල මධ්‍යම ආණ්ඩුවට පවරා ඇති අතර කෘෂිකර්ම,අධ්‍යාපන,සෞඛ්‍ය වැනි බලතල ප්‍රාන්ත වෙත පවරා තිබේ. |

**04 .යටත් විජිත පාලන අවධිය තුළ බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ නිසා මෙරට තුළ ඇතිවූ සමාජ,ආර්ථික සහ දේශපාලන පරිවර්තන සාකච්ඡා කරන්න.** (ලකුණු 20)

යටත් විජිත පාලන අවධිය තුළ පහත සඳහන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් බව සඳහන් කරමින් පිළිතුර සඳහා ප්‍රවේශය ලබා ගැනීම.

i. 1833 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

ii. 1910 ක්‍රෑව් මැකලම් ප්‍රතිසංස්කරණය

iii. 1920 මැනිං ප්‍රතිසංස්කරණය

iv. 1924 මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය

v. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

මෙහිදී ප්‍රධාන වශයෙන්ම

* දේශපාලන ක්‍රමය-ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් බවට පරිවර්තනය කරන ලද බව

* ආර්ථික ක්‍රමය-වැඩවසම් ක්‍රමයෙන් ධනවාදී ආර්ථික ක්‍රමයක් බවට පරිවර්තනය කරන ලද බව

* සමාජ ක්‍රමය-නොදියුණු සමාජ ක්‍රමය දියුණු සමාජ ක්‍රමයක් බවට පරිවර්තනය කරන ලද බව පහත පරිවර්තන ඉදිරිපත් කරමින් සනාථ කළ යුතුය.

දේශපාලන පරිවර්තන -

- ✓ මධ්‍යගත පාලනයක් සඳහා අවශ්‍ය පදනම වැටීම.
- ✓ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සඳහා පදනම දැමීම.
- ✓ ඒකීය නීති ක්‍රමයක් ඇති කිරීම.
- ✓ ඒකීය අධිකරණ ක්‍රමයක් ඇති කිරීම.
- ✓ නියෝජන සිද්ධාන්තය හඳුන්වා දීම.
- ✓ වගකීම් සහිත පාලන ක්‍රමයක් නිර්මාණය වීම.
- ✓ මෙරට දේශපාලන පක්ෂ ආරම්භ වීම.
- ✓ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය සඳහා අවශ්‍ය පදනම වැටීම.

- ✓ ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියන් බිහිවීම.
- ✓ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යාපාර බිහිවීම.
- ✓ පුද්ගලයන්ගේ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් වර්ධනය වීම.
- ✓ රාජ්‍ය සහ ආණ්ඩුව එකිනෙකින් වෙන්වීමට අවශ්‍ය පදනම වැටීම.

සමාජ සහ ආර්ථික පරිවර්තන -

- ✓ ද්විත්ව ආර්ථිකයක් නිර්මාණය වීම.
- ✓ වාණිජ වතු වගාව ආරම්භ වීම.
- ✓ ශ්‍රම වෙළඳපොලක් නිර්මාණය වීම.
- ✓ යටිතල පහසුකම් ක්ෂේත්‍රය වර්ධනය වීම.
- ✓ ඉඩම් වෙළඳපොලක් නිර්මාණය වීම.
- ✓ දේශීය ව්‍යවසායක පන්තියක් නිර්මාණය වීම.
- ✓ ද්‍රව්‍යවලින් බදු ගෙවීම වෙනුවට මුදලින් බදු ගෙවීම ආරම්භ වීම.
- ✓ ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකය බිඳ වැටීම.
- ✓ ආනයන අපනයන ආර්ථිකයක් සඳහා පදනම් වැටීම.
- ✓ වැඩවසම්වාදය  බිඳවැටීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස කුලවාදය බිඳවැටීම.
- ✓ ජනවර්ග අතර සමගිය නැතිවීම.
- ✓ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය බිඳවැටීම.
- ✓ කණ්ඩායම්වාදය වෙනුවට පුද්ගලවාදය අගයන සමාජ සම්බන්ධතා වර්ධනය වීම.
- ✓ ගම සහ නගරය වශයෙන් ප්‍රාදේශීය බෙදීමක් ඇතිවීම.
- ✓ සමාජ සජීවීකරණය වේගවත් වීම.
- ✓ උඩුකුරු සමාජ සචලතාවයක් ඇතිවීම.
- ✓ ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබූ මධ්‍යම පංතියක් නිර්මාණය වීම.

මෙවැනි සමාජ,ආර්ථික සහ දේශපාලන පරිවර්තන පිළිතුර සඳහා ප්‍රමාණවත් අයුරින් ඉදිරිපත් කොට කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

**5. "සෝල්බරි ව්‍යවස්ථාව වෙස්ට්මිනිස්ටර් ආකෘතියට අනුව සකස් කරන ලද්දකි." සාකච්ඡා කරන්න.**

(ලකුණු 20)

වෙස්ට්මිනිස්ටර් ආකෘතියේ ආණ්ඩුක්‍රමයක් යනු බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාවේ ඇතුළත් ප්‍රධාන ලක්ෂණ සහිත ආණ්ඩුක්‍රමයක් බව සඳහන් කොට එම ලක්ෂණ පහත පරිදි දැක්වීම.

- ✓ ආණ්ඩුක්‍රම ව්‍යුහය තුළ කේන්ද්‍රීය ස්ථානය පාර්ලිමේන්තුවට හිමිවීම
- ✓ පාර්ලිමේන්තුව නෛතික වශයෙන් උත්තරීතර වීම.
- ✓ පාර්ලිමේන්තුවට වග කියන කැබිනට් මණ්ඩලයක් පැවතීම.
- ✓ විධායකය (අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය) ව්‍යවස්ථාදායකය තුළින් තේරී පත්වීම.
- ✓ ආණ්ඩුව පාර්ලිමේන්තුව මගින් පාලනය කිරීම.

- ✓ පාර්ලිමේන්තුවේ අධිකාරීත්වයට නිසැක වශයෙන්ම අභියෝග කළ නොහැකි ලෙස අධිකරණයේ භූමිකාව සීමා සහිත වීම.
- ✓ කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමය මත පදනම් වූ ද්වි පක්ෂ ක්‍රමය.
- ✓ රාජ්‍ය නායකයා නාමික විධායකයකු වීම.

- මෙම ලක්ෂණ සෝල්බරි ආණ්ඩුක්‍රමයට අදාළව කෙටියෙන් විස්තර කිරීම.
- මේ ආකාරයට නාමික විධායකය පිහිටුවීමේදීත් කැබිනට් මණ්ඩලය පිහිටුවීමේදීත් පාර්ලිමේන්තුවේ ව්‍යුහය සකස් කිරීමේදීත් සෝල්බරි ව්‍යවස්ථාව වෙස්ට්මිනිස්ටර් ආකෘතිය අනුගමනය කර ඇති බව දැක්වීම.
- මේ ලක්ෂණ වලට අනුව බලන විට සෝල්බරි ආණ්ඩුක්‍රමය එහි මූලික ස්වභාවය අතින් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයට බොහෝදුරට සමාන වුවද, බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයට වෙනස් වූ පහත සඳහන් අතුරු කාරණා ද දැක ගත හැකි බව දක්වා පිළිතුර අවසන් කොට තිබිය යුතුය.
- එනම්
  - ➢ සෝල්බරි ව්‍යවස්ථාව ලිඛිත ව්‍යවස්ථාවක් වීම.
  - ➢ සාපේක්ෂ වශයෙන් අනම්‍ය ව්‍යවස්ථාවක් වීම.
  - ➢ ව්‍යවස්ථා විවරණ බලය සීමිත සහ අප්‍රකාශිත ලෙස අධිකරණයට හිමිවීම.

**06. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත මාතෘකාවලින් ඕනෑම දෙකක් තුළනාත්මකව සාකච්ඡා කරන්න.**

**i. පාර්ලිමේන්තු පරමාධිපත්‍යය (ලකුණු 10)**

- සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙන්ම ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද වෙස්ට්මිනිස්ටර් ආකෘතියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වන බව දැක්වීම.
- ඉන්පසු සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුවේ ව්‍යුහය සහ එහි බලතල සඳහන් කිරීම.
- නමුත් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව මෙන් ස්වාධිපත්‍යය බලයක් සෝල්බරි පාර්ලිමේන්තුවට හිමි නොවූ බව දක්වා එහි ව්‍යවස්ථාදායක බලය සීමා කරන පහත කරුණු කෙටියෙන් විස්තර කිරීම.
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29(2) උප වගන්තිය.
  - අධිකරණය සතු අධිකරණ විවරණ බලය.
  - බ්‍රිතාන්‍ය ප්‍රිවිකවුන්සලය සතු බලය.
  - අග්‍රාණ්ඩුකාරවරයා සතු බලය.
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අධිකරණය ව්‍යවස්ථාදායකට වඩා බලවත් වීම.
- ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකය වන ජාතික රාජ්‍ය සභාවේ ව්‍යුහය දැක්වීම.
- සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය සීමා වුවද ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සඳහන් 1,2,3,4,5 වගන්ති හරහා ජාතික රාජ්‍ය සභාව උත්තරීතර ආයතනයක් බවට පත්කොට ඇති ආකාරය කෙටියෙන් විස්තර කිරීම අවශ්‍ය වේ.
- මීට අමතරව ජාතික රාජ්‍ය සභාව පනවන නීතියක ව්‍යවස්ථානුකූලභාවය සොයා බැලීමට කිසිදු අධිකරණයකට බලයක් නොමැති බව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ එහි කොටසක් පරිච්ඡින්න කිරීමේ හෝ සංශෝධනය කිරීමේ බලයද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැනවීමේ බලයද ජාතික රාජ්‍ය සභාවට ඇති බව, පූර්ණ ව්‍යවස්ථාදායක බලය හිමි වෙනත් කිසිදු අධිකාරියක් පිහිටුවීමට ජාතික රාජ්‍ය සභාවට

නොහැකි නමුත් අනු නීති සකස් කිරීමේ බලය හිමි අධිකාරියක් පිහිටුවීමට ජාතික රාජ්‍ය සභාවට බලය ඇති බව, අතීතයට බලපාන ආකාරයේ නීති ඇතුළුව ඕනෑම නීතියක් සම්පාදනය කිරීමේ බලය ජාතික රාජ්‍ය සභාවට ඇති බව,රාජ්‍ය මූල්‍ය පාලන බලතල හා විධායකය පාලනය කිරීමේ බලය ඇතුළු විශාල බලතල ප්‍රමාණයක් ජාතික රාජ්‍ය සභාව සතුවන බැවින් එය පරමාධිපත්‍ය බලය හිමි ව්‍යවස්ථාදායකයක් වන බව විස්තර කිරීම.

- මේ අනුව සෝල්බරි පාර්ලිමේන්තුවට පරමාධිපත්‍ය බලය හිමි නොවූ බවත් ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ ජාතික රාජ්‍ය සභාවට පරමාධිපත්‍ය බලය හිමිවූ බවත් සඳහන් කොට පිළිතුර අවසන් කළ හැකිය.

### ii. අධිකරණයේ ස්වාධීනත්වය. (ලකුණු 10)

- සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ අධිකරණ කටයුතු බ්‍රිතාන්‍ය මහ රැජිණගේ නාමයෙන් ක්‍රියාත්මක වූ බව සහ එම කාලය තුළ මෙරට ඉහළම අධිකරණය ලෙස බ්‍රිතානය ප්‍රිවිකවුන්සිලය කටයුතු කළ බව දැක්වීම.
- සෝල්බරි යුගයේ මෙරට ක්‍රියාත්මක වූ අධිකරණය ඉහළ අධිකරණ සහ පහළ අධිකරණ ලෙස ස්ථර දෙකකින් යුක්ත වන බව දැක්වීම.
- ඉහළ අධිකරණ විනිසුරුවන්ගේ ස්වාධීනත්වය සඳහා ගෙන තිබූ පත්කිරීම සම්බන්ධ විධි විධාන, ඉවත් කිරීම සම්බන්ධ විධිවිධාන, වැටුප් සම්බන්ධ විධිවිධාන දැක්වීම
- ඉහළ අධිකරණ විනිසුරුවන් හැර අනෙක් සියලුම පහළ අධිකරණ විනිසුරුවන් හා උපලේඛනගත නිලධාරීන් අධිකරණ සේවය වශයෙන් සලකන බවත්, අධිකරණ සේවය ස්වාධීනත්වය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව ස්ථාපිත කළ බවත් දක්වා ඒ සම්බන්ධ විධිවිධාන දැක්වීම.
- ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ඉහළ අධිකරණ විනිසුරුවන්ගේ ස්වාධීනත්වය සඳහා ගෙන තිබූ පත්කිරීම් ඉවත් කිරීම සහ වැටුප් සම්බන්ධ විධිවිධාන ද සඳහන් කර, මෙම කාලය තුළ අධිකරණ සේවයේ පත් කිරීම් ,මාරු කිරීම් ,විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම් යන සියල්ල අමාත්‍ය මණ්ඩලයට පැවරුණ බවත් මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයට උපදෙස් ලබාදීම සඳහා අධිකරණ සේවා උපදේශක මණ්ඩලය හා අධිකරණ සේවා විනය මණ්ඩලය වශයෙන් ආයතන දෙකක් ස්ථාපිත කළ බවත් සඳහන් කර ඒ පිළිබඳ විස්තර කර දැක්වීම.
- නමුත් සෝල්බරි ආණ්ඩුක්‍රමයෙහි අධිකරණ සේවා කොමිෂන් සභාවට මෙන් ස්වාධීන බලයක් ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමයේ ස්ථාපිත කළ ඉහත ආයතන දෙකට නොමැති බව සඳහන් කිරීම.
- එමෙන්ම ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීමට හා හදිසි පනත් සකස් කිරීමේදී ජාතික රාජ්‍ය සභාවට සහාය දීම සඳහා 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය'යනුවෙන් විශේෂිත ආයතනයක් ස්ථාපිත කළ බව දැක්වීම.
- අවසාන වශයෙන් නිගමනය ලෙස අධිකරණයේ ස්වාධීනත්වය සෝල්බරි ආණ්ඩු ක්‍රමයට සාපේක්ෂව ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ ආරක්ෂා නොවුන බව සඳහන් කිරීම.

### iii. රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය (ලකුණු 10)

- සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ රාජ්‍ය සේවය යනු අග්‍රාණ්ඩුකාරවරයා, කැබිනට් මණ්ඩලය සහ ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් හැර රජයේ වැටුප් ලබන සියලුම සේවාවන් වන බව.
- ඉහළ රාජ්‍ය නිලධාරීන් පත් කිරීම ,මාරු කිරීම, ආදී බලතල භුක්ති විඳිනු ලබන්නේ අගමැතිවරයාගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා විසින් බවත්, පහළ මට්ටමේ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් නැතහොත් රාජ්‍ය සේවයේ පත් කිරීම් ,මාරු කිරීම්, උසස් කිරීම් සේවයෙන් පහ කිරීම් සහ විනය පාලනය කිරීම් ආදී සියලු බලතල ක්‍රියාත්මක කිරීම ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම විසින් සිදු කරන බව දක්වා කෙටියෙන් විස්තර කිරීම.
- ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවයද ඉහළ සහ පහළ යනුවෙන් ස්ථර දෙකකින් යුක්ත වන බවත්, ජනාධිපතිවරයා විසින් පත්කරන ඉහළ රාජ්‍ය සේවකයන් හැර රාජ්‍ය සේවයේ පත් කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් හා විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම් අමාත්‍ය මණ්ඩලයට පැවරෙන අතර අමාත්‍ය මණ්ඩලයට ඒ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව අහෝසි කොට 'අධිකරණ සේවා උපදේශක මණ්ඩලය සහ අධිකරණ සේවා විනය මණ්ඩලය' යනුවෙන් ආයතන දෙකක් ස්ථාපිත කළ බව දැක්වීම.
- නමුත් අමාත්‍ය මණ්ඩලය විසින් මෙකී ආයතනවල උපදෙස් පිළිපැදීම අනිවාර්ය නොවන බවත් එනිසාම රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය ක්‍රමය යටතේ බිඳවැටුනු ආකාරයත් විස්තර කිරීම.

- නිගමනය ලෙස රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය සෝල්බරි ආණ්ඩු ක්‍රමයට සාපේක්ෂව ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවෙන් බිඳ වැටුණු බව සඳහන් කිරීම.

### iv. නාමික විධායකය (ලකුණු 10)

- සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ නාමික විධායකය අග්‍රාණ්ඩුකාරවරයා වන අතර ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ නාමික විධායකය ජනාධිපතිවරයෙක් වන බව.
- සෝල්බරි අග්‍රාණ්ඩුකාරවරයා, අගමැතිවරයා නම් කිරීමෙන් පසුව බ්‍රිතාන්‍ය රැජින විසින් නිල වශයෙන් පත්කරනු ලබන අතර ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමයෙහි ජනාධිපතිවරයා අගමැතිවරයා විසින් පත්කරනු ලබන බව.
- අග්‍රාණ්ඩුකාරවරයාගේ නිල කාලය ව්‍යවස්ථාවෙහි සඳහන් නොවුවද සම්ප්‍රදායක් ලෙස එය අවුරුදු 05ක් වන අතර ජනාධිපතිවරයාගේ නිලකාලය අවුරුදු 04ක් වන බව.
- දෙදෙනාගේම බලතල සඳහන් කිරීම.
- දෙදෙනාගේම බලතල තුලනාත්මකව විමසීමේදී සෝල්බරි අග්‍රාණ්ඩුකාරවරයා මෙන්ම ජනාධිපතිවරයා වෙතද අතිශය වැදගත් බලතල සම්භාරයක් හිමිවී ඇති නමුත්, සෝල්බරි අග්‍රාණ්ඩුකාරවරයා සතුව පැවැති සමහර බලතල ජනාධිපතිවරයා වෙත ලබාදී නොමැති බව සඳහන් කිරීම. එනම් පාර්ලිමේන්තුව සම්මත කළ අණපනත්වලට ස්වකීය අත්සනින් අනුමැතිය ලබාදීම හෝ පාර්ලිමේන්තුව වෙතට නියෝජිතයන් නාමකරණයෙන් පත්කිරීම වැනි බලතල ආග්‍රාණ්ඩුකාරවරයා සතු වූවත් ජනාධිපතිවරයාගෙන් එම බලතල ඉවත්කොට ඇති බව දැක්විය යුතුය.
- කෙසේ වෙතත් 1972 ආණ්ඩුක්‍රමයේ ජනාධිපතිවරයා සහ සෝල්බරි ආග්‍රාණ්ඩුකාරවරයා අතර යම් යම් සමානකම් ද දක්නට ලැබුණි. විශේෂයෙන්ම බලතල සහ එම බලතල ක්‍රියාත්මක කරන ආකාරය අනුව බොහෝ සෙයින් මෙම ධූරයන් දෙකම සමාන ස්වරූපයත් ගනු ලැබීය. එසේ වුවද අග්‍රාණ්ඩුකාරවරයා මෙන් ජනාධිපතිවරයා වෙතින් අධිරාජ්‍යවාදී ගැති ස්වභාවයක් පිළිබිඹු නොවුණි. මන්ද එතුමා අග්‍රාණ්ඩුකාරවරයා මෙන් විදේශීය නායකයෙකුගේ නියෝජිතයෙකු නොවූ බැවිනි. ඒ නිසා එම ධූරය තුළින් ලාංකීය ප්‍රජාවගේ නිදහස මෙම ජනරජයේ ස්වාධිනත්වය සහ ස්වෛරීභාවය ද පිළිබිඹු කෙරුණි. රටේ ජනතාවට ජනාධිපතිවරයා යනු දේශීය නායකයකු යන හැඟීමෙන් කටයුතු කිරීමේ අවස්ථාවද උදා විය. කෙසේ වෙතත් ඉහතින් දක්වන ලද බලතල ජනාධිපතිවරයාට තමන්ට අවශ්‍ය පරිදි භුක්ති විඳීමේ බලයක් හෝ හැකියාවක් නැත. ඒ අනුව එම සියලු බලතල ජනාධිපති විසින් විසින් භුක්ති විඳිය යුතු වූයේ අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයේ උපදෙස්වලට අනුකූලව ය. එබැවින් ජනාධිපතියා යනු සෝල්බරි අග්‍රාණ්ඩුකාරවරයා මෙන් නාමික විධායකයක් බව පැහැදිළි වන්නේය යනුවෙන් තුලනාත්මකව විස්තර කොට තිබිය යුතුය.

## 07. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත මාතෘකාවලින් දෙකක් සාකච්ඡා කරන්න.

### i. ජනාධිපතිවරයා, නීති සම්පාදන ක්‍රියාවලිය සහ පාර්ලිමේන්තුව ජජ

දෙවන ජනරජ ව්‍යවස්ථාවෙන් ගොඩනගන ලද පාර්ලිමේන්තුව ඒකමාණ්ඩලික ව්‍යවස්ථාදායකයකි. එහි සභිකයන් සංඛ්‍යාව 225ක් වන අතර ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ සාමාජිකයකු නොවේ. එනිසා ජනාධිපතිට පාර්ලිමේන්තුවට බලපෑම් කිරීමේ හැකියාවක් නැතැයි කෙනෙකුට සිතිය හැකිය. කෙසේ වුවත් සත්‍ය තත්ත්වය වන්නේ ජනාධිපතිවරයාට පැවරී ඇති බලතල භාවිතයට ගනිමින් ඉතා දැඩි ලෙස පාර්ලිමේන්තුවට බලපෑම් කරන ආකාරය දැකිය හැකිය. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ නීති සම්පාදන ක්‍රියාවලිය සඳහා ජනාධිපතිවරයා කරනු ලබන බලපෑම සුළු පටු නැත. පාර්ලිමේන්තුවේ නීති සම්පාදන ක්‍රියාවලිය කෙරෙහි ජනාධිපතිවරයාගෙන්වන මෙම බලපෑම නිසා පාර්ලිමේන්තුව දුර්වල ආයතනයක් බවට පත්වීම වැළැක්විය නොහැකිය. පාර්ලිමේන්තුවේ නීති සම්පාදන ක්‍රියාවලිය කෙරෙහි ජනාධිපතිවරයාගෙන් එල්ල වන බලපෑම පහත කරුණු ඔස්සේ පෙන්වා දිය හැකිය.

1. පාර්ලිමේන්තුව කැඳවීම,වාර අවසාන කිරීම හා විසුරුවා හැරීම.

2.පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම්වල මුලසුන දරමින් එය හැසිරවීමේ බලය.

3. ඒ ඒ සභා වාරයන්හිදී පාර්ලිමේන්තුවට පැමිණ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

4. පාර්ලිමේන්තුවට පැමිණීමට, ඇමතීමට සහ ඊට සංදේශ යැවීමට ඇති බලය.

5. පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් සිදුවන විවාදයන්ට සම්බන්ධ වීම.

6. කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසත් එහි ප්‍රධානියා ලෙසත් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් පිළියෙළ කිරීමට සම්බන්ධ වීම.

7. ජනමත විචාරණ කැඳවීමේ බලය.

මේ යටතේ,

- ව්‍යවස්ථාවේ 1,2,3,6,7,8,9,10,11(2),30(2),62(2) යනවා වගන්ති සංශෝධනය කිරීම සඳහා වූ යෝජනා
- ජනමත විචාරණය සඳහා ඉදිරිපත් කළ යුතු යැයි අමාත්‍ය මණ්ඩලය විසින් තීන්දු කරන අණ පනත්
- ජනමත විචාරණය සඳහා යොමු කළ යුතු යැයි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කරන ආණපනත්
- ජාතික වැදගත්කමක් ඇතැයි ජනාධිපති විසින් කල්පනා කරන ඕනෑම කරුණක්

8. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, කැබිනට් ඇමතිවරු සහ නියෝජ්‍ය ඇමතිවරුන් වශයෙන් පත්කොට ඔවුන්ගේ සහාය ලබාගෙන තමන්ට අවශ්‍ය කරන අණපනත් අපහසුවකින් තොරව පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගැනීමට ජනාධිපති කටයුතු කළ හැකි විම.

ඉහත කරුණු වන්නේ පැහැදිලි වන්නේ නිල මට්ටමින් හෝ නිල නොවන මට්ටමින් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවට බලපෑම් කළ හැකි බවත් හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තම වසඟයට ගෙන පාර්ලිමේන්තුව තමන්ට අවශ්‍ය පරිදි කටයුතු කරන ආයතනයක් බවට පත් කර ගැනීමට ජනාධිපතිවරයාට හැකියාව ඇති බවත්ය. පාර්ලිමේන්තුවට බලපෑම් කිරීමට මේ අයුරින් ජනාධිපතිවරයාට හැකියාව තිබුණද ජනාධිපතිවරයා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ඇති බලය සහ කළ හැකි බලපෑම ඉතාම අල්ප වේ. ජනාධිපතිවරයා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට කළ හැකි එකම බලපෑම වන්නේ ජනාධිපතිවරයා ධූරයෙන් ඉවත් කිරීම සඳහා දෝශාභියෝගයක් සම්මත කිරීමයි. නමුත් එම විධිවිධානය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම ඉතාම අසීරු ක්‍රියාවලියකි. මේ අනුව ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වඩා බලවත් බවත්, පාර්ලිමේන්තුව දුර්වල ආයතනයක් බවට පත්කර ඇති බවත් නිගමනය කළ හැකිය.

### ii. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය. (ලකුණු 10)

මූලික අයිතිවාසිකම් යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඇතුළත්ව පවතින අයිතිවාසිකම් වේ. මෙරට මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රථම අත්දැකීම වන්නේ 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් අයිතිවාසිකම් ය. නමුත් ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නීතිමය යාන්ත්‍රණයක් හඳුන්වා දී නොතිබුණි.1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද මූලික අයිතිවාසිකම් හඳුන්වා දුන් අතර ඒවා ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 10 වන වගන්තියේ සිට 14 වගන්තිය තෙක් වගන්තිවල සඳහන් වේ. එමෙන්ම දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඒවාට ක්‍රියාවට නැංවීමේ නෛතික යාන්ත්‍රණයක් ද හඳුන්වා දෙනු ලැබීය. එනම්,

1. අයිතිවාසිකම් කඩවීමේ චෝදනා විභාග කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දීම.

2. ඔම්බුඩ්ස්මන්ධූරය පිහිටුවීම.

- ඉහත සඳහන් යාන්ත්‍රණය විස්තර කිරීම
- අයිතිවාසිකම් කඩවීම සම්බන්ධව කටයුතු කිරීම සඳහා ඉහත සඳහන් යාන්ත්‍රණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කර ඇති අතර පාර්ලිමේන්තු පනතක් තුළින් අවශේෂ යාන්ත්‍රණයක් ලෙසින් මානව හිමිකම් කොමිෂන් සභාවද ස්ථාපිත කර ඇති බව සඳහන් කරමින් පිළිතුර නිමා කළ හැකිය.

### iii. විධායකය සහ රාජ්‍ය සේවය (ලකුණු 10)

- 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විධායකය වන්නේ ජනාධිපති සහ ඔහු යටතේ සිටින අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලයයි. අනෙක් අතට රාජ්‍ය සේවය යනු විධායකයේම කොටසකි. එනම් ස්ථිර විධායකයයි. සත්‍ය විධායකය විසින් ගනු ලබන තීන්දු තීරණ සහ ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙම රාජ්‍ය සේවය මගිනි. මෙකේ විධායකයත් රාජ්‍ය සේවයත් අතර ඇති සම්බන්ධය පිළිබඳව මෙහිදී සාකච්ඡා කරනු ලබන බව.
- ඉහළ මට්ටමේ රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාද, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයද, සෙසු පහළ මට්ටමේ රාජ්‍ය නිලධාරීන් තමයි සම්බන්ධයෙන් කිරීම්, මාරු කිරීම් ආදිය සිදුකිරීම අමාත්‍ය මණ්ඩලයේ බලපෑමට ලක් වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ද ක්‍රියාවට නංවන බව විස්තර කිරීම.
- වැඩිදුරටත් සාකච්ඡා කිරීමේදී සමස්ත රාජ්‍ය සේවය ම දේශපාලන අධිකාරියේ විශේෂයෙන්ම විධායකයේ පාලනයට හා මෙහෙයවීමට ලක් කොට ඇති බව දැක්විය යුතුය.
- රාජ්‍ය සේවය පාලනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයත් අමාත්‍ය මණ්ඩලයේ මෙහෙයවීමට ලක්වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් සම්බන්ධ වී තිබුණද අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ලෙස ජනාධිපතිවරයාට රාජ්‍ය සේවයේ සියලු ක්ෂේත්‍රවල පත්කිරීම් හා මාරු කිරීම් සඳහා බලපෑම් කළ හැකි බවත්, දෙපාර්තමේන්තු ප්‍රධානෙන් පවා පත් කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් සිදු කළ යුතු වුවද ඒ සඳහා ජනාධිපතිවරයාගේ බලපෑම එල්ල වන බවත් දැක ගත හැකි බව විස්තර කිරීම.
- මේ අනුව මෙරට රාජ්‍ය සේවය පාලනය කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ බලපෑම හා මැදිහත්වීම සුළුපටු නොවන බව දැක්වීම.
- කෙසේ වෙතත් රාජ්‍ය සේවයේ නිසි කාර්යක්ෂමතාවයක් ඇති කර ගැනීමටත්, ආණ්ඩුවේ කටයුතු රාජ්‍ය සේවය හරහා නිසි පරිදි ක්‍රියාවට නංවා ගැනීමටත්, රාජ්‍ය සේවය කෙරෙහි දේශපාලන බලපෑම් දක්නට ලැබිය හැකි නමුත් එම දේශපාලන මැදිහත්වීම් අනිසි හා අයුතු ආකාරයෙන් එල්ල වීම වැළැක්වීම සඳහා යම් නියාමනයක් තිබීම බෙහෙවින් වැදගත් බව ප්‍රකාශ කරමින් පිළිතුර නිම කළ හැකිය.

### iv. පාර්ලිමේන්තුව (ලකුණු 10)

- තෝරා පත් කර ගැනීම,සංයුතිය,නිල කාලය හා ක්‍රියා පටිපාටිය දැක්වීම. (සංශෝධනවලට යටත්ව)
- පාර්ලිමේන්තුව සතු පහත බලතල කෙටියෙන් විස්තර කිරීම.
    - ව්‍යවස්ථාදායක බලතල
    - විධායකය පාලනය කිරීමේ බලය
    - රාජ්‍ය මූල්‍ය පාලන බලතල
    - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ බලය
- 1972 ව්‍යවස්ථාවෙහි පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාව මෙන් දෙවැනි ජනරජ ආණ්ඩක්‍රමය යටතේ පාර්ලිමේන්තුව උත්තරීතර නොවන බව ඊට අදාළ කරුණු සහිතව විස්තර කිරීම. විශේෂයෙන්ම ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ ජාතික රාජ්‍ය සභාව නීති පැනවීමේ කාර්යය සිදු කළ තනි ආයතනය වුවත් වර්තමාන ආණ්ඩුක්‍රමය තුළ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාවට නැගීමේ පාර්ශව දෙකක් හඳුන්වා දී තිබීම
    - පාර්ලිමේන්තුව මගින්
    - ජනමත විචාරණයකදී ජනතාව විසින්
- පාර්ලිමේන්තුවේ උත්තරීතර භාවයට අභියෝගකාරී වූ සාධක පහත පරිදි දැක්වීම

1. නීති සම්පාදනය සඳහා ජන මත විචාරණය ද යොදා ගැනීම.

2. ව්‍යවස්ථාවේ සමහර වගන්ති (1,2,3,6,7,8,9,10,11,30(2),62(2)) පාර්ලිමේන්තුවට තනිව සංශෝධනය නොහැකි නිසා ජනමත විචාරණ පැවැත්විය යුතුවීම.

3. ව්‍යවස්ථාවේ සමහර වගන්ති මගින් පාර්ලිමේන්තුවේ බලය සීමා කර තිබීම (75 වගන්තිය)

4. පාර්ලිමේන්තු කටයුතු කෙරෙහි ජනාධිපතිවරයාට ඇති විශේෂ බලය

5. රාජ්‍ය ව්‍යුහය කේන්ද්‍රීය ස්ථානය පාර්ලිමේන්තුවට නොව ජනාධිපතිවරයාට හිමිවීම.

- පාර්ලිමේන්තුවේ වැඩි ඡන්දයෙන් සම්මත කරනු ලැබූ පනතකට කතානායකවරයාගේ සහතිකය ලැබුණු පසු එම නීතියේ වලංගුතාව ප්‍රහීන කළ නොහැකි බවද 1978 ව්‍යවස්ථාව තුළ කියයි. එවැනි පනතක වලංගුභාවය කවරාකාරයකින් හෝ ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණයකට හෝ අධිකරණ ආයතනයකට හෝ බලය නැති බව 80(3) වගන්තියේ සඳහන් වේ.'ව්‍යවස්ථාදායක පරමාධිපත්‍යය'යන සංකල්පය ගැබ් කරගත් මෙම වගන්තිය මුලින්ම හඳුන්වා දෙන ලද්දේ 1972 ව්‍යවස්ථාව මගිනි .එම වගන්තිය විසින් 1972 සහ 1978 ව්‍යවස්ථා දෙක මගින් කරන ලද්දේ පනත් අධිකරණ විමර්ශනයට ලක් කිරීම, නැතහොත් නීති පිළිබඳ අධිකරණ විමර්ශනය ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියෙන් ඉවත් කිරීමයි. නමුත් මෙම කාරණය මත පමණක් පිහිටා 1978 ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද පාර්ලිමේන්තුව උත්තරීතර ආයතනයක් ලෙස පිළිගැනීම නිවැරදි නැති බව පෙන්වා දෙමින් පිළිතුර නිම කළ හැකිය.

**08. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පැහැදිලි කරන්න**

**(i). ඇමෙරිකානු ආණ්ඩු ක්‍රමයේ සාමාන්‍ය ලක්ෂණ**
**(ii). ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ පදනම**
(iii). ප්‍රංශ ආණ්ඩු ක්‍රමයේ පරිපාලන බලය විමධ්‍යගතකිරීම.

(i). ඇමෙරිකානු ආණ්ඩු ක්‍රමයේ සාමාන්‍ය ලක්ෂණ **(ලකුණු 10)**

අතීතයේ ඇමරිකානු ප්‍රදේශවල පැවති ජනපද 13 බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ලෙස පැවතුණි. 1776 දී ඇමරිකන් නිදහස් සටනින් පසු එම ජනපද 13 එකට එකතුකර සහසන්ධීය ආණ්ඩුක්‍රමයක් ගොඩනගන ලදී. 1787 දී නව ආණ්ඩුක්‍රමයක් සම්පාදනය කර 1789 සිට ක්‍රියාත්මක කරනු ලැබිය. එලෙස ගොඩනැගූ ආණ්ඩුක්‍රමය වර්තමානය දක්වා ක්‍රියාත්මක වන අතර එහි පහත සඳහන් ලක්ෂණ හඳුනාගත හැකිය.

- ලිඛිත ව්‍යවස්ථාවක් පැවතීම
- සම්ප්‍රදායන් හා භාවිතවලින් සමන්විත වීම
- දෘඩ භාවය හෙවත් අනම්‍යභාවය
- ෆෙඩරල් ආණ්ඩුක්‍රමයක් පැවතීම
- බලතල බෙදීම හා සංවරණ තුළන මූලධර්ම භාවිත කිරීම
- ජනාධිපති ආණ්ඩු ක්‍රමයක් පැවතීම
- ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් පැවතීම
- අධිකරණ විවරණ බලය පැවතීම
- ද්විත්ව අධිකරණ පද්ධතියක් පැවතීම
- මූලික අයිතිවාසිකම් ප්‍රඥප්තියක් ඇති කර තිබීම
- ද්විත්ව පුරවැසිභාවයක් ක්‍රියාත්මකක වීම
- සමූහාණ්ඩුවාදය ක්‍රියාත්මක වීම
- මහජන පරමාධිපත්‍යය පදනම් කරගත් ආණ්ඩු ක්‍රමයක් වීම

(ii). **ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ පදනම (ලකුණු 10)**

ඉන්දියාව විශාල භෞමික රාජ්‍යයකි. එමෙන්ම බහු සංස්කෘතික රාජ්‍යයක් ද වේ. මේ නිසා ඒකීය රාජ්‍ය ක්‍රමයකින් ඉන්දියාව කළමනාකරණය කළ නොහැකි වේ. එබැවින් ඉන්දියාව පාලනය කිරීමේ හොඳම විසඳුම වන්නේ ෆෙඩරල් ක්‍රමයයි. මේ අනුව ඉන්දියානු සංධීය ක්‍රමය තුළ මූලික පදනම් සාධක කිහිපයක් දැකගත හැකිය. ඒවා ඉන්දියානු පෙඩරල් ක්‍රමයේ පදනම ලෙසද හඳුනාගත හැකිය.

- ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක් පැවතීම
- නම්‍යශීලී සංධීය ක්‍රමයක් පැවතීම
- නීති සම්පාදන බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී තිබීම
- මූල්‍ය සම්බන්ධතා
- පරිපාලන සම්බන්ධතා

- අන්තර් ආණ්ඩු අතර ගැටුම් ශ්‍රේෂ්ඨාධිකරණය හා අන්තර් ප්‍රාන්ත කවුන්සිලය විසඳීම. (මෙම කරුණු කෙටියෙන් විස්තර කර තිබිය යුතුය)

**(iii) ප්‍රංශ ආණ්ඩු ක්‍රමයේ පරිපාලන බලය විමධ්‍යගතකිරීම. (ලකුණු 10)**

- දේශපාලන බලය විමධ්‍යගත කිරීම ප්‍රංශ අණ්ඩුක්‍රමයේ නොමැත.
- ප්‍රංශයේ ඇත්තේ පරිපාලනය විමධ්‍යගත කිරීම යි.
- පරිපාලන බලය විමධ්‍යගතකරණයේ දී ප්‍රාදේශීය ඒකකවලට දේශපාලන ස්වාධීනතාව නැත.
- ඒ මඟින් ආණ්ඩු ක්‍රමයේ ඒකීය ස්වභාවය අවධාරණය වේ. ශක්තිමත් මධ්‍යම ආණ්ඩුව විසින්, ආණ්ඩුවේ පරිපාලන තන්ත්‍රය මධ්‍යයේ පාලනයට යටත් ව පරිධිය තෙක් විමධ්‍යගත කිරීමක් මින් අදහස් වේ.
- ප්‍රංශයේ පස්වැනි සමූහාණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව විසින් නිර්මාණය කරනු ලැබ ඇත්තේ දේශපාලන බලය විමධ්‍යගත කිරීමක් නොව පරිපාලන විමධ්‍යගත කිරීමකි.
- ප්‍රංශ පළාත් පාලනය (උපජාතික මට්ටම)
  - ප්‍රංශ ආණ්ඩුව, උපජාතික මට්ටම්වල සමස්ත පාලනය ඇති වන ආකාරයට ගොඩ නැගූ බලගතු මධ්‍යම ආණ්ඩුවකි. උපජාතික ආණ්ඩු තල 3ක් යටතේ සංවිධානය කර තිබේ. ඒවා නම්,

    කලාප

    දෙපාර්තමේන්තු (කලාපවල කුඩා ප්‍රාදේශීය ඒකක)

    කොමියුන (ප්‍රජා ඒකක) හෙවත් පළාත් පාලන ආයතන. යන මේවා ය.

- ප්‍රංශය කලාප 22කින් සහ දෙපාර්තමේන්තු 96 කින් යුක්ත ය. ඒවා Arrondissements යන උප ඒකක 320කට සහ කැටන්ටන් 3530කට බෙදා ඇත. කොමියුන 36383ක් ද වේ.
- පොදු තීන්දු ගැනීම ඉහත තල 3 දී සිදු කෙරේ. ඒවායේ තීන්දු ගන්නා ආයතන කාණ්ඩ 4 කට බෙදා දැක්විය හැකි ය.

  නියෝජිත සභා.

  ප්‍රිෆෙක්ට් අධිකාරීන්

  මධ්‍යම ආණ්ඩුවේ ප්‍රාදේශීය ක්ෂේත්‍ර කාර්යාල.

  වෘත්තීය සංගම් හා බලපෑම් කණ්ඩායම්.

- මේ අනුව මහජන නියෝජිතයෝ, මධ්‍යම රජයේ නිලධාරීහු සහ ප්‍රාදේශීය සිවිල් සමාජය තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වෙති.

නියෝජිත සභා.

- නියෝජිත සභා සෑම මට්ටමක ම දක්නට ලැබේ. කලාප මට්ටමේ දී වක්‍ර ව තෝරාගත් සභා දෙකක් ඇත. එනම් කලාප මණ්ඩලය හා ආර්ථික හා සමාජ කමිටුව යි. දෙපාර්තමේන්තු මට්ටමේ දී දෙපාර්තමේන්තු මණ්ඩල දක්නට ලැබේ. කොමියුන මට්ටමේ දී ක්‍රියාත්මක වන්නේ නාගරික සභා ය.
- 22ක් පමණ වූ කලාප සැකසී ඇත්තේ දෙපාර්තමේන්තුවලිනි. එහි ප්‍රධාන වගකීම වන්නේ කලාපීය සංවර්ධනයට පර්යේෂණ යෝජනා මඟින් හෝ වෙනත් ආකාරවලින් හෝ දායකවීම ය. කලාප විධායක නිලධාරියා ප්‍රිෆෙක්ට්වරයා ය. ඔහුට සහයට කලාප සභාව හා ආර්ථික හා සමාජ කමිටුව පිහිටා තිබේ. කලාප සභාව නියෝජිත කණ්ඩායම් තුනකින් සමන්විත ය.

  කලාපයෙන් තේරිපත් වූ මධ්‍යම ව්‍යවස්ථාදායකයේ උභය මණ්ඩලවල නියෝජිතයන්.

  දෙපාර්තමේන්තු කවුන්සිල නියෝජිතයෝ

  කොමියුන් සභාවල නියෝජිතයෝ

- කලාප කවුන්සිලයේ වගකීම වන්නේ කලාප අයවැය සම්මත කිරීම ය. ආර්ථික හා සමාජ කමිටුවේ කාර්යභාරය උපදේශාත්මක එකකි. එයට වෘත්තීය හා අභිලාෂ කණ්ඩායම් ඇතුළත් ය.
- ඒ ඒ පළාත්බද දෙපාර්තමේන්තුවලට, දෙපාර්තමේන්තු සභා පිහිටුවා තිබේ. ඒවායේ නියෝජිත සංඛ්‍යාව 17-109 තෙක් වෙනස් වේ. මේවායේ සභිකයෝ සර්වජන ඡන්දයෙන් සමානුපාතික ක්‍රමයට වර්ෂ 6කට තෝරා ගැනෙති. සභිකයන් ගෙන් 1/2 සෑම වර්ෂ 3කට වරක් තෝරා ගැනෙයි. එහි විධායක ප්‍රධානියා වූයේ දෙපාර්තමේන්තු මට්ටමට පත් කර සිටින ප්‍රිෆෙක්ට්වරයා ය. එහි න්‍යාය පත්‍රය, කාල සටහන, අයවැය සකසන්නේ ඔහු ය. මෙය දෙපාර්තමේන්තු මධ්‍යම රජයට සේවා සපයන ඒජන්සි ආයතනයක් ලෙස ක්‍රියාත්මක වෙයි. එනම් මාර්ග, පාසල් හා සුභසාධන සේවා සම්පාදනය කිරීම ය. නීතියෙන් අවහිර කර නොමැති තාක් දුරට ඒවාට සිය ප්‍රතිපත්ති ප්‍රාරම්භනය කළ හැකි ය.
- ‘කොමියුන’ යනු ප්‍රංශයේ සියලු නගර සභාවලට භාවිත කරන පොදු වචනය යි. කොමියුනයේ ප්‍රමාණය මත වෙනස් වන මැතිවරණ ක්‍රමයකට අනුව සර්වජන ඡන්දයෙන් තෝරා ගනු ලබන නගර සභා කොමියුන මට්ටමේ දී ක්‍රියාත්මක වේ. කොමියුනයේ මහජන නියෝජන සභාව වන්නේ නගර සභාව යි. විධායක නිලධාරියා වන්නේ නගරාධිපති යි. ඒවායේ ප්‍රධාන වගකීම් නම්,
    - මධ්‍යම ආණ්ඩුව විසින් පවරා දෙන ලද වගකීම් ඉටු කිරීම. එය සේවා සැපයීම වෙනුවෙන් අය කිරීම් කරන අතර සේවා සැපයීම ප්‍රමුඛ කාර්යය ලෙස ඉටු කරයි.
    - තම තුල්‍යතාව මත නිතියෙන් තහනම් නොකරන ලද කටයුතු කිරීම, එය තුලිත අයවැයක් ඉදිරිපත් කිරීමට බැඳී ඇත.

ප්‍රිෆෙක්ට් අධිකාරීහු :

- ප්‍රිෆෙක්ට් කණ්ඩායම් යනු ප්‍රංශ පරිපාලනයේ මධ්‍යම ආණ්ඩුව නියෝජනය කරමින් ප්‍රාදේශීය ව සේවය කරන හා මධ්‍යම ආණ්ඩුවේ ඒ ඒ අමාත්‍යාංශවල කාර්යයන් ප්‍රාදේශීය මට්ටමේ දී සම්බන්ධීකරණය කරන හා ආණ්ඩුවේ සංකේතය වශයෙන් ප්‍රාදේශීය මට්ටමේ දී පෙනී සිටින නිලධාරි කණ්ඩායම යි.
    - කලාප ප්‍රිෆෙක්ට්වරයා.
    - දෙපාර්තමේන්තු ප්‍රිෆෙක්ට්වරයා
    - උප ප්‍රිෆෙක්ට්වරයා යන මට්ටම්වලින් දැකගත හැකි ය

09. **(i). ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හැඩගැස්වීම කෙරෙහි බලපාන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 10)**

**(ii). අන්තර්ජාතික දේශපාලනයේ සමකාලීන ප්‍රවණතා සැකෙවින් විස්තර කරන්න (ලකුණු 10)**

**(i). ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හැඩගැස්වීම කෙරෙහි බලපාන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 10)**

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය තීරණය කිරීම සඳහා බලපාන්නා වූ සාධක ගණනාවකි.

- **භූ දේශපාලන පිහිටීම**

මෙහිදී ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගත ස්ථානයක දූපතක් ලෙස පිහිටා තිබීම හා ඉන්දියාවට ආසන්නව එහෙත් වෙන්ව පිහිටා තිබීම නිසාත්, දකුණු ආසියානු උපභූගෝලීය කලාපය තුළ ක්‍රියාත්මක වන රටක් ලෙස විදේශ ප්‍රතිපත්තිය සකස් කර ගත යුතු ආකාරය පිළිබඳව විස්තර සැපයිය යුතුය.

- **සමාජ සංස්කෘතික සාධක**

ශ්‍රී ලංකාව බහුවර්ගික බහු සංස්කෘතික සමාජයක් වීම නිසා එයට අනුරූප විදේශ ප්‍රතිපත්තිය සකස් කරගෙන පැවතීම

- **දේශපාලන ආර්ථික සාධක**

ශ්‍රී ලංකාව සෙසු රාජ්‍යයන් හා සමඟ සංසන්දනය කිරීමේදී කුඩා ආර්ථිකයක් හිමි රටක් වීමත්, සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයක් ලෙස පැවතීමත් යන සාධක විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන බව විස්තර කළ යුතුය.

- **පාලන තන්ත්‍රයේ දේශපාලන අභිලාෂ**

  පාලනයේ හසුරවන දේශපාලන පක්ෂය හෝ කණ්ඩායමේ හෝ ප්‍රතිපත්ති හා අභිලාෂ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන බව විස්තර කිරීම

- **කලාපීය හා ජාත්‍යන්තර බල තුලනය**

  කලාපීය වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් ලෝක දේශපාලනය තුළ සිදුවන දෑ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කළ යුතුය.

- **ජන සමාජයේ අපේක්ෂා හා අධිපති දෘෂ්ටීන්**

  පුරවැසියන්ගේ දේශපාලන මතවාද ඔවුන් දරන අදහස් ආකල්ප මේ සඳහා බලපාන බව පැහැදිලි කළ යුතුය

(ii). **අන්තර්ජාතික දේශපාලනයේ සමකාලීන ප්‍රවණතා සැකෙවින් විස්තර කරන්න (ලකුණු 10)**

- අතීත ලෝකය තුළ යුරෝපා කේන්ද්‍රීය බල තුලනයෙන් පසු ද්විධ්‍රැවීය ලෝක දේශපාලනයක් පැවත තිබේ.
- සෝවියට් දේශය ප්‍රමුඛ නැගෙනහිර යුරෝපා රටවල්වල සමාජවාදය බිඳ වැටීමත් සමග 1990 දශකයේ දී ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ ලිබරල් ධනවාදය ජයග්‍රහණය කළා යැයි බොහෝ විද්වතුන්ගේ මතය විය.
- වර්තමානය වන විට අන්තර්ජාතික දේශපාලනයේ පහත ප්‍රවණතා දැක ගත හැකිය.
  - බහු ධ්‍රැවීය දේශපාලනයක් බවට පත්ව තිබීම
  - විකල්ප ජාත්‍යන්තර සම්බන්ධතා ජාල
  - නව සමාජ ව්‍යාපාර ක්‍රියාත්මක වීම
  - පශ්චාත් කොවිඩ් පර්යාය
  - රුසියානු නේටෝ අර්බුද
  - සයිබර් ප්‍රහාර
  - ඇමරිකා එක්සත් ජනපදය ලෝක බලවතා වීමට දරන උත්සාහය
  - දේශගුණික විපර්යාස
  - චීන ලෝක ආර්ථිකය (යනාදී සංකල්ප විස්තර කළ යුතුය)

10.

I. නිරාගමිකවාදය **(ලකුණු 10)**

- නිරාගාමිකවාදය යනු ආගම සහ දේශපාලනය මිශ්‍ර නොකිරීම යි.
- රාජ්‍ය ක්ෂේත්‍රයට ආගමේ බලපෑමක් ද, ආගමික ක්ෂේත්‍රයට රාජ්‍යයේ බලපෑමක් ද නොමැතිව, ඒ දෙක එකිනෙකට වෙනස් සහ ස්වාධීන ව ක්ෂේත්‍ර දෙකක් කොට සැලකිය යුතු ය යන අදහස ප්‍රකාශ කරන මතවාදයකි.
- මේ සම්බන්ධ ව තියුණු සාකච්ඡාවක් ඉන්දියාවේ සිදුවෙමින් පවතින අතර, රාජ්‍යය නිරාගමික විය යුතු බව 1975 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කළ සංශෝධිතයෙන් ද කියවේ.
- 18-19 සියවස්වල යුරෝපයේ මෙහි සම්භවය ඇති විය.
- යුරෝපීය නිරාගාමිකවාදය, මධ්‍යකාලීන යුගයේ අවසානය දක්වා කාලයේ ප්‍රධාන මතවාදයක් වූ අතර රාජ්‍යය සහ පල්ලිය අතර පැවති ආයතනික බන්ධනය මත රාජාණ්ඩුවේ ආරක්ෂකයා ලෙස පල්ලිය පෙනී සිටීමට එරෙහි ව වර්ධනය විය.
- රාජණ්ඩු ක්‍රමයට විරුද්ධ වූ බලවේග රාජ්‍යය හා පල්ලිය අතර පැවති මේ "අශුද්ධ සන්ධානයට ද" එරෙහි වීමෙන් නිරාගමිකවාදය මතු වන්නේ එම අරගලයේ දෘෂ්ටිවාදීමය ප්‍රතිඵලයක් ලෙසිනි.
- නිරාගාමික වාදය මතු වීමට තවත් හේතුවක් ලෙස යුරෝපීය ප්‍රබුද්ධ යුගයේ මතු වූ තර්ක බුද්ධියට මුල්තැන දීම පෙන්වා දිය හැකි ය. එය පල්ලිය පවත්වාගෙන ගිය බුද්ධිමය ආධිපත්‍යයට

එරෙහි විය.

ලිබරල් නිරාගමිකවාදයේ මූලධර්ම :

රාජ්‍යය සහ පල්ලි ආයතනික වශයෙන් වෙන් කිරීම:

රාජ්‍යයේ ස්වභාවය සහ රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම යනාදියට ආගම මැදිහත් නො විය යුතුය

ආගමික කටයුතු සඳහා රාජ්‍යය මැදිහත් නොවිය යුතුය

රාජ්‍ය කිසි ම ආගමකට පක්ෂපාතිත්වයක් නොමැති විය යුතු ය.

සමාජවාදී නිරාගමිකවාදය :

මාක්ස්වාදීහු ආගම සමාජ පීඩනයේ ආයතනයක් ලෙසත්, ලෝකය පිළිබඳ ව සාවද්‍ය අවබෝධයක් පීඩිත ජනයාට ලබාදෙන මතවාදි පද්ධතියක් ලෙසත් හැඳින්වූහ.

සමාජවාදී රාජ්‍යය සම්පූර්ණයෙන් ම ආගමෙන් වෙන් විය යුතු ය.

ආගමට පැවතිය හැක්කේ රාජ්‍යයේ අවසරය මත පමණි.

සමාජවාදී ක්‍රමයක දී ආගමික, දේශපාලන ආයතනවලට නිදහස නැත.

ඉන්දියානු නිරාගමිකවාදය :

ලිබරල් සම්භවයක් ඇති ව ඉන්දියානු නිරාගමිකවාදය ගොඩ නැඟී ඇත.

ඉන්දියානු නිරාගමිකවාදයේ ප්‍රධාන ලක්ෂණ :

මෙහි අර්ථ දෙකක් තිබේ.

- ධර්ම නිරපේක්ෂතා
- සර්ව ධර්ම සම්භාව

නිරාගමිකවාදය සහ දේශපාලනය :

නිරාගමිකවාදයෙන් කෙරෙන්නේ රාජ්‍යය සහ ආගම අතර සම්බන්ධය, රාජ්‍ය ප්‍රතිපත්ති හා පුරවැසි අයිතිවාසිකම් ආගමික පදනමකින් තොර ව නිර්ණය කිරීම යි.

එහෙත් දේශපාලනයට ආගම සම්බන්ධ නොවිය යුතු බව ඉන් අදහස් නොවේ.

නිරාගමිකවාදයේ වර්තමාන වැදගත්කම :


ආගමික මූලධර්මවාදය පදනම් කොටගත් ආගමික රාජ්‍යය බිහි වීමේ හැකියාව.

බහු සංස්කෘතික වාදය පදනම් කොට ගෙන, ආගමික අනන්‍යතාව ඇති සුළු ජන ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

## II. ගැටුම් ජීවන චක්‍රය (ලකුණු 10)

- ගැටුමක් යන්න කෙටියෙන් හැඳින්වීම
- ගැටුම්වල ජීවන චක්‍රය ඇමරිකානු විද්වතෙකු වන ලුවිස් ක්‍රිස්බර්ග් විසින් ඉදිරිපත් කර ඇත.

ගැටුම්වල ජීවන චක්‍රය (Conflict Life Cycle)




එහි අවධි කිහිපයකි

- ගැටුම් පාදක කොන්දේසි හේතු
- ගැටුම් පැන නැගීම
- ගැටුම උත්සන්නවීම
- ගැටුමේ උත්සන්නතාව අඩුවීම
- අනොන්‍යාන්‍ය වශයෙන් රිදෙන හිරවීම
- ගැටුම කෙළවර කිරීම
- සාම සාකච්ඡා
- පශ්චාත් සාමය ගොඩනැගීම (විස්තර කළ යුතුය)

## III. දේශපාලන පක්ෂවල කාර්යයන් (ලකුණු 10)

- මැතිවරණ හෝ වෙනත් මාධ්‍යයක් මගින් ආණ්ඩු බලය ලබා ගැනීම අරමුණු කරගෙන ගොඩනගා ඇති සංවිධාන දේශපාලන පක්ෂයක් ලෙස හඳුනාගත හැකිය.
- මෙහි කාර්යයන් කිහිපයකි,
  - ✓ නියෝජනය
  - ✓ දේශපාලන ප්‍රභූ විස්තර නිර්මාණය කිරීම හා අලුත් කොටස් බඳවා ගැනීම
  - ✓ සමාජ කණ්ඩායම්වල දේශපාලන අරමුණු සම්පාදනය කිරීම
  - ✓ මහජන ඡන්ද දායක අභිලාෂ දේශපාලන ක්‍රියාවලිය ඇතුළට ගෙන ඒම
  - ✓ මහජනයා දේශපාලන ක්‍රියාකාරීත්වයට මෙහෙයවීම හා නායකත්වය දීම
  - ✓ ආණ්ඩුවේ කටයුතු සංවිධානය කිරීම

## IV. බලතල බෙදීම (ලකුණු 10)

- බලතල බෙදා හැරීමකින් ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණය යන එකිනෙකට සම්බන්ධ නොවන ආයතන තුනක් අතර ආණ්ඩුවේ කාර්යයන් බෙදීම සිදු වේ .
- බලතල බෙදීම පිළිබඳ අදහස මුලින්ම ඉදිරිපත් කරනු ලැබුවේ ඇරිස්ටෝටල් විසිනි.
- ඉන් පසු එළැඹුණු රෝම මධ්‍යතන යුගවල බලතල බෙදීමක් පිළිබඳව දක්නට නොලැබුණි.
- බලතල බෙදීම සිද්ධාන්තයක් ලෙස ඉදිරිපත් කරනු ලැබුවේ චාල්ස් මොන්ටෙස්ක්‍යු විසිනි
- මේ සම්බන්ධව අදහස් ඊ.එස් කෝවින් ද ඉදිරිපත් කර ඇත.
- බලතල බෙදීමක් තුළින් ලැබෙන ප්‍රයෝජන.
- චාල්ස් මොන්ටෙස්ක්‍යු විසින් ඉදිරිපත් කළ මෙම න්‍යාය ප්‍රායෝගිකව භාවිතයට ගන්නා ආකාරය (පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්න).

## V. රාජ්‍ය ප්‍රතිපත්ති හා අධිකරණය (ලකුණු 10)

- රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමය තුළ නිතර අවධානය යොමු නොවන එහෙත් ඒ සම්බන්ධ ව වැදගත් ආයතනයක් ලෙස අධිකරණය හැඳින්විය හැකි ය.
- ප්‍රතිපත්ති සම්බන්ධ නෛතික ගැටලු ඇති වූ විට ඒවා අර්ථකථනය කරන්නේත්, ඒවායේ ව්‍යවස්ථානුකූල බව පරීක්ෂා කරන්නේත් අධිකරණය යි.
- එබැවින් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයෙහි ලා අධිකරණයට ද, ප්‍රතිපත්ති දායකත්වය හා ක්‍රියාවලිය තීරණය කිරීමෙහි ලා සැලකිය යුතු අධිකාරි බලයක් හිමි වේ.
- යම් නීතියක් රටේ මූලික ව්‍යවස්ථාවට අනුකූල නොවේ යැයි අධිකරණය තීරණය කළහොත්
- ප්‍රතිපත්තිය එතෙකින් අවසන් වේ.
- මේ බලය අධිකරණයට හිමි වන්නේ අධිකරණ විමර්ශන බලය හිමි ව තිබේ නම් පමණි. එසේ ම ඇතැම් රාජ්‍යවල අධිකරණයට, පනත් කෙටුම් පත් අවස්ථාවේ දී ප්‍රතිපත්තියේ ආකෘතිය හැඩගැස්වීමෙහි ලා උපදේශාත්මක බලයක් හිමි ව තිබේ.
  (උදාහරණ දක්වමින් විස්තර කරන්න)